**ශීර්ෂය 198 - වාරිමාර්ග අමාත්‍යාංශය**
**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 198 - වාරිමාර්ග අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වාරිමාර්ග අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 සැප්තැම්බර් 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ඔක්තෝබර් 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1. 3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 3.11 කළමනාකරණ දුර්වලතා | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දී ඇති නියෝග ක්‍රියාත්මක කර ඒ පිළිබඳ තක්සේරුවක් සමඟ රාජ්‍ය ගිණුම්කාරක සභාව වෙත වාර්තා කළ යුතුය. | 3.6 (ආ) කළමනාකරණ දුර්වලතා |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**1.6.1.1 ආදායම් ලැබීම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඒසීඒ-1(ii) ආකෘතිය මූලික ආදායම් ඇස්තමේන්තුව සහ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අතර විචලතාව පහැදිලි කිරීම පිළිබඳ ප්‍රකාශයේ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව ලෙස රු.1,335,900,000 ක් සටහන් කල යුතු වුවද, එහි මූලික ආදායම් ඇස්තමේන්තුව වූ රු.1,275,355,000 ක් සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව ලෙසද සටහන් කර තිබුණි. මේ හේතුවෙන් ආකෘතියේ "වෙනස මූලික ආදායම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස" සහ "වෙනස්කම්ලට හේතු" දක්වා නොතිබූ අතර සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.60,545,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් ලබාගත් මූලික ඇස්තමේන්තුවේ සඳහන් මුදල මෙහි දක්වා ඇති අතර, සංශෝධිත ඇස්තමේන්තුවක් පිළිබඳ විධිමත් තොරතුරු නොමැති වීම හේතුවෙන් එම රු. 1,275,355,000 ක මුදල දක්වා ඇති අතර සංශෝධනයක් නොමැති නිසා වෙනසක් පිළිබඳව හා ඊට හේතු දක්වා නොමැත. | ආදායම් ප්‍රකාශයේ නිවරදි දත්ත ඇතුළත් කළ යුතුය. |

**1.6.1.2 විගණන සාක්ෂි නොවීම**

| නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂය අංක 198-2-3-2506 යටතේ 2023 වර්ෂය තුල වැයකල රු. 33,582,127,928 කින් රු.25,897,281,327 ක් එනම් සියයට 77 ක්, වෙනත් වැය ශිර්ෂ අංක 07 ක ගණන්දිමේ නිළධාරින් විසින් වැයකර මාසික ගිණුම් සාරාංශ මගින් වාර්තාකර තිබුණි. ඊට අදාල වියදම් මු.රෙ.146(අ) හා (ආ) විධිවිධානයන්ට අනුකූලව වෙනත් ගණන්දිමේ නිලධාරින් විසින් සිදුකර ඇතත් එම සහතික කිරීමට අදාල තොරුතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | අපගේ වැය ශීර්ෂයන්ට අදාලව වෙනත් වැය ශීර්ෂ කිහිපයක් මගින් දරන ලද වියදම් සනාථ කිරීම් සඳහා අවශ්‍ය ලේඛණ අමාත්‍යාංශය සතුව පවතින අතර අනෙකුත් ශීර්ෂ වල වියදම් දුරකතන මගින් විමසා සනාථ කර ගන්නා ලදි.විගණන විමසුම මගින් පෙන්වා දී ඇති පරිදි වෙනත් ගණන්දීමේ නිලධාරීන් විසින් දරනු ලබන වියදම් සනාථ කරවා ගැනීම සඳහා මෙම වසරේ සිට විධිමත් ක්‍රමවේදයක් සකස් කර ඇත. | වෙනත් ගණන්දිමේ නිලධාරින් විසින් සිදුකර ඇති වියදම් සහතික කර ගැනීමට කටයුතු කල යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අතපසුවීමකින් එම සහතිකවීම 2023 වර්ෂය සඳහා සිදු කිරීමට නොහැකි වී ඇති අතර ඉදිරි වසරේ සිට නිවැරදි කිරීමට කටයුතු සලසා ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරික්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i) | මු.රෙ. 447 | 33,582,127,928 | පොදු 138 අකෘතියට අනුකූලව, දරා ඇති වියදම්වල නිවැරදිභාවය තහවුරු කර ගැනීමට අවශ්‍ය තොරතුරු කිසිවක් ඇතුළත් කර නොතිබුණි. | 2506 (යටිතල පහසුකම් සංවර්ධනය) වැය විෂයෙහි ප්‍රතිපාදන වෙන් කරනු ලබන්නේ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා වන අතර සාමාන්‍ය වැය ලෙජරයේ ඇතුලත් කල යුතු ගෙවීම් විස්තර පිලිබඳ කරුණු අමාත්‍යාංශයේ වැය ලෙජරයේ 2506 වැය | ව්‍යාපෘතීන් වල වියදම CIGAS පද්ධතිය ඔස්සේ ගිණුම් ගත කිරීමට පහසුකම් සලසා ගත යුතුයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | විෂය යටතේ සටහන් කිරීමට නොහැකි වේ. තවද , මෙම ව්‍යාපෘතීන් වල CIGAS පද්ධතිය ඔස්සේ ගිණුම් ගත කිරීමට පහසුකම් නොමැති බැවින් ඔවුන් සෑම මසකම අවසානයේ අමාත්‍යාංශය වෙත සහතික කරන ලද වියදම් වාර්තා ඉදිරිපත් කරනු ලැබේ. | |
| (ii) | මු.රෙ. 571 (3) | 2,209,455 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ව්‍යාපෘති සඳහා වෙන්කල මුදල් උපයෝජනය කිරීමකින් තොරව පොදුතැන්පත් ගිණුම්වල රඳවා ගෙන තිබුණි. | වැලිමඩ හා ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යවන ලද පිළිවෙලින් රු. 396,525 හා රු. 1,812,930 . මුදල සම්බන්ධයෙන් වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් හා ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් වියදම් වාර්තාවක් කැඳවීමට කටයුතු කරනු ලැබේ. | උපයෝජනය නොකල මුදල් අනුමැතියකින් තොරව පොදුතැන්පත් ගිණුම්වල රඳවා නොගත යුතුය. |
| (ආ) | 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 (ඉ) ඡේදය | 472,184 | සේවය හැර ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් අය විය යුතු රු. 472,184 ක ණය ආපසු අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | සේවය හැර ගිය ටී.ඒ.ඩී.දයානන්ද මහතාගෙන් අයවිය යුතු රු.73,062 ක ණය මුදල මාසිකව ගෙවීම් කිරීමට එකඟවී ඇති අතර එය ඔහු විසින් 2024.07.23 දින රු.5000 ක මුදලකින් ගෙවීම ආරම්භ කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අය විය යුතු ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදය | 434,066 | වර්ෂ 5කට වැඩි කාලයක් තිස්සේ හඳුනානොගත් ණයගැති ශේෂ මෙම වාර්තාවේ දින වන විටත් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2017 වර්ෂයට පෙර සිට පැවත එන රු.434,066 ක ණය ශේෂය මෙතෙක් නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකි වී ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ණය ශේෂ අයකර ගත යුතුය. |

## 2.3 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මොරගහකන්ද කළුගඟ කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතියට තීරුබදු සහන බලපත්‍ර යටතේ වාහන 180 ක් හා යන්ත්‍රෝපකරණ 182 ක් 2013 හා 2014 වර්ෂවලදී ආනයනය කර තිබූ අතර එම බලපත්‍රයන්හි වලංගු කාලය වසර 1 ත් 2 ත් අතර පරාසයක පැවති අතර ව්‍යාපෘතිය 2016 ජුලි 22 දිනෙන් අවසන් වියයුතු වුවද 2018 අප්‍රේල් 26 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කර ඇතත් ඊට අනුරූපීව අදාල බලපත්‍රයන් හි කාලය දීර්ඝ නොකර එම වාහන අවිධිමත් පරිහරණයට ඉඩකඩ සලසා තිබුණි.ආනයන බලපත්‍ර කොන්දේසි උල්ලංගනය හේතුවෙන් වාහන 41 ක් ශ්‍රී ලංකා රේගුව වෙත භාරදෙන ලෙස දැනුම් දී තිබුණි. එයින් වාහන 16 ක් කොන්ත්‍රාත් සමාගම විසින්ද ඉතිරි වාහන 30 ක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින්ද භාවිතා කරන බව රේගුවේ ප්‍රධාන සහකාර නිවාරන නිලධාරී වෙත දැනුම් දී තිබුණි. එසේම වාහන 46 ක් පිලිබඳව සඳහන් ඇතත් අදාල උපලේඛන ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් අතිරේක වාහන 5 හඳුනාගත නොහැකි විය. මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්‍ෂ (කාර්ය පැවරුම්)ගේ ලිපිය අනුව කොන්ත්‍රාත් සමාගම විසින් මෝටර්රථ වල අයිතිය පවරා ගැනීම සඳහා වු ලිපි ලේඛන ඉදිරිපත් කර ඇති බව සඳහන් වුවද අමාත්‍යාංශය සතුව පැවතිය යුතු ලිපි ගොනුව විගණනයට ඉදිරිපත් නොවීය. මෙම ව්‍යාපෘතිය සඳහා ආනයනය කරන ලද තවත් වාහන 134 ක් හා භාණ්ඩ අයිතම 182 ක් කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම පරිදි පවරා දීමට වාරිමාර්ග අමාත්‍යාංශයේ විරෝධතාවයක් නොමැතිබව වාරිමාර්ග අමාත්‍යාංශ අතිරේක ලේකම් විසින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත දැනුම් දි තිබුණි.කොන්ත්‍රාත්කරු වෙත පවරන ලද වාහන 16 සම්බන්ධයෙන් කරන ලද පරීක්‍ෂණයෙන් අනතුරුව රේගු ආඥාපනතේ විධි විධාන යටතේ අයකළ හැකි රු.මි. 476 ක දඩය රු.මි. 105 ක් දක්වා අඩුකර 2020 ඔක්තෝබර් 15 දින අයකර ඇතත් එම වාහන හා භාණ්ඩ තීරුබදු අයකර කොන්ත්‍රාත්කරු වෙත පැවරුබවට විගණනයට තහවුරු නොවීය. | ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමත් සමඟ එම වාහන පාවිච්චි කිරීමේ කාලය ද දීර්ඝ කිරීමට ඉල්ලුම්කර නොමැති වීම එම ව්‍යාපෘති කාර්යාලයේ අතපසු වීමකි. දැනට එම නිලධාරීන් කිසිවෙකු නොමැති බැවින් තොරතුරු සොයා ගැනීමේ හැකියාවක් නොමැත. ගිවිසුමෙහි 14:1 (b) වගන්තිය යටතේ ආනයනය කරන ලද භාණ්ඩ කොන්ත්‍රාත්කරු විසින් ප්‍රතිඅපනයනය නොකරන්නේ නම් අදාළ බදු මුදල් ගෙවා මෙම රටෙහි භාවිත කිරීමට ප්‍රතිපාදන සලසා ඇත. එහිදී ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් පැහැදිලි කර ඇත්තේ ගිවිසුමේ පරිදි පසුව කොන්ත්‍රාත්කරු හට ප්‍රතිඅපනයනය නොකරන භාණ්ඩ බදු ගෙවා පවරා ගැනීමක් සිදු කර ගත හැකි බවයි. | වාහන බලපත්‍ර කාලසීමාව දීර්ඝ කිරීම හා ඒවා පැවරීමේ නීත්‍යානුකූල භාවය, තහවුරු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 49,994 ක් වූ ඵලදායිතා ප්‍රවර්ධනය සහ වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතාව කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය (PEISEIP) සහ තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය යන ව්‍යාපෘති 2 සඳහා සැලසුම් කළ කාලය මෙන් දෙගුණයකටත් වැඩි කාලයක් ගතවී තිබුණද නිමකර නොතිබුණි. 2017 හා 2014 වර්ෂවල සිට ආරම්භ කර තිබූ එම ව්‍යාපෘතීන්හි කාලය දීර්ඝ කිරීම සඳහා විවිධ අවස්ථාවන්හිදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබුණ ද එම ප්‍රමාදයන් හේතුවෙන් මූලික අරමුණු යටතේ හඳුනාගෙන තිබූ වාසි සැලසුම්ගත පරිදි ලබා ගැනීමට නොහැකි වීම පිළිබඳව විශ්ලේෂණයක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද උක්ත ව්‍යාපෘති **2** සඳහා වර්ෂ 9 ක කාල සීමාවක් තුළ දරා ඇති රු. මිලියන 2,354.05ක පිරිවැයෙන් මේ දක්වා ජාතික ආර්ථිකයට කිසිදු දායකත්වයක් ලැබී නොතිබුණි | 2017 වර්ෂයේ ආරම්භ කර 2020 දක්වා වැඩකටයුතු සිදුකරගෙන ගිය අතර 2020 හා 2021 වර්ෂ වල ඇති වූ කොවිඩ් වෛරස තත්වය මත ව්‍යාපෘතියේ ඉලක්ක සපුරා ගත නොහැකි විය. දැනට ඇති කර ගනු ලැබ ඇති බැඳීම් සඳහා පමණක් අවශ්‍ය ප්‍රතිපාදන 2023 අයවැය ඇස්තමේන්තු මගින් වෙන් කර දීම පිණිස අනුමැතිය ලබා දී ඇතත් ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාමට ප්‍රතිපාදන ලබා දී නොමැත. මේ සඳහා වැය වූ සමස්ථ පිරිවැය රු.මිලියන 1,188.35 ක් වේ මෙම ප්‍රගතිය සමස්ථ ව්‍යාපෘතියෙන් සියයට 13.16 ක් වුවද ජාතික ආර්ථිකයට යම් දායකත්වයක් ලැබී ඇත. ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කළ ද ප්‍රතිපාදන නොලැබීම මත ව්‍යාපෘතිය තාවකාලිකව නැවතී ඇත.<br>තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය සඳහා 2014.09.04 දින අමාත්‍ය මණ්ඩලය අනුමැතිය මත 2014.11.28 දින චීනයේ ඉදිකිරීම් සමාගමක් සමඟ කොන්ත්‍රාත්තුව අත්සන් කර 2018.08.01 දින චීනයේ එක්සිම් බැංකුව සමඟ ණය ගිවිසුම අත්සන් කර ඇතත්, ණය ගිවිසුම සක්‍රිය නොකිරීම නිසා කොන්ත්‍රාත්කරු වැඩ බිම හැරගිය නමුත් විස්තරාත්මක විමර්ශන කටයුතු සිදු කර ඇත.එසේම ඉඩම් අත්පත් කරගැනීම ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ද සැලසුම් කටයුතු CECB ආයතනය මගින්ද සිදු කරමින් පවතී.නමුත් දැනටමත් ප්‍රවාහනය කර ඇති පෙර සවි පාලම සවි කිරීම ඇතුළු මාර්ගයේ ඉතිරි කි.මි. 7හි ඉදිකිරීම් කඩිනමින් නිම කර,ඉතිරි ක්‍රියාකාරකම් පසුව ක්‍රියාත්මක කිරීම පිණිස ව්‍යාපෘතිය තාවකාලික නැවැත්වීම යන 2022.10.07 දිනැති RAMP තීරණය අනුව ව්‍යාපෘතියේ වැඩ තාවකාලිකව නවත්වා ඇත.ඒ අනුව පෙර සවි පාලම ඉදිකිරීම අවසන් කර ඇත. ප්‍රවේශ මාර්ග දෙකක වැඩ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර ඇති අතර ඌව පරණගම සහ කන්දෙකැටිය නගර දෙක යා කෙරෙන ප්‍රවේශ මාර්ගයේ වැඩ සියයට 55 ක් අවසන් | ව්‍යාපෘති 2 සඳහා දරා ඇති පිරිවැයෙන් මූලික අරමුණු සඳහා දායකත්වයන් පිළිබඳ නැවත විමසා බැලිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කර ඇත. එම මාර්ගය ද මෙම වසර අවසන් වීමට පෙර වැඩ නිම කිරීමට අපේක්ෂිතය. | |
| (ආ) | 2014 වර්ෂයේ ආරම්භ කළ ගිං නිල්වලා ව්‍යාපෘතිය සඳහා 2014.09.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව 2014.11.05 වන දින වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය, චීනයේ ඉදිකිරීම් සමාගමක් සමඟ ඇ.ඩො. මිලියන 690ක වටිනාකමකින් යුත් ඉංජිනේරුමය ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) ගණයේ කොන්ත්‍රාත්තුවක් සඳහා ගිවිසුමක් අත්සන් කර තිබුණි. 2017වර්ෂයේ නිම කිරීමට යෝජිතව තිබූ මෙම ව්‍යාපෘතිය සඳහා රු.4,011,054,982ක සංචලන අත්තිකාරමක් 2014 හා 2015 වර්ෂවල ගෙවා තිබුණි.මූලික භූ විද්‍යාත්මක සමීක්ෂණ හා මැනුම් කටයුතු ආරම්භ කළද 2015 දී ව්‍යාපෘතිය නතර කරන ලදී. 2023 වර්ෂයේ සිට කාර්යය වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පවරා ඇතත් මේ දක්වා කටයුතු ආරම්භ කර නැත. 2023 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 4,089.54ක් වැය කර ඇතත් කිසිදු දායකත්වයක් මෙම ව්‍යාපෘතිය මගින් ජාතික ආර්ථිකයට ලැබී නොතිබුණි. | 2014 දෙසැම්බර් මස හා 2015 ජනවාරි මස ස්ථානගත වීමේ අත්තිකාරම් (Mobilization Advance) ලබා දී මිනුම් කටයුතු සහ විස්තරාත්මක ශක්‍යතා අධ්‍යනය මේ වන විට අවසන් අදියර දක්වා පැමිණ ඇත. 2014 වසරේදී යෝජිතව තිබූ නිර්මිතයන් සඳහා අධ්‍යනය කරගෙන යෑමේදී ඇති වූ පාරිසරික හා සාමාජීය ප්‍රශ්ණ හේතුවෙන් යම් යම් වෙනස්කම් යෝජනා කරමින් කරන ලද ශක්‍යතා අධ්‍යන වාර්තාව 2020 මැයි මස දී වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයට ලබා දී තිබේ. පාරිසරික ගැටළු එකඟතාවන් ලබා ගැනීම දුෂ්කර වී ඇත. ව්‍යපෘති කළමනාකරණ ඒකකයේ කාර්යයන් 2023 මාර්තු 31 වන දින අවසන් කර වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ව්‍යාපෘතිය භාර දී ඇතත්. ව්‍යාපෘතියේ අධ්‍යන කටයුතු වරින් වර නැවැත්වීමට කටයුතු කර ඇති බැවින් හා අදාළ පාරිසරික අනුමැතියන් ලබා ගැනීමට මෙතෙක් නොහැකි වීම මත ව්‍යාපෘතිය සිදු කරගෙන යාමේ ප්‍රමාද වීම් සිදු වී ඇති බව දන්වමි. | ව්‍යාපෘති සඳහා වර්ෂ 8 ක කාල සීමාවක් තුළ දරා ඇති පිරිවැයෙන් මූලික අරමුණු සඳහා දායකත්වයක් පිලිබඳ නැවත විමසා බැලිය යුතු අතර අදාළ පාරිසරික අනුමැතියන් ලබා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | උමා ඔය ද්‍රෝණියේ සිට දක්ෂිණ කලාපයේ කිරිඳිඔය ද්‍රෝණියට ජලය ඝන මීටර් මිලියන 145 ක් වාර්ෂිකව හැරවීම ප්‍රධාන අරමුණ කරගෙන ශ්‍රී ලංකා වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය හා ඉරාන සමාගමක් සමඟ 2008 අප්‍රේල් 28 දින ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. ඊට අදාළ සංශෝධිත මුළු පිරිවැය ඇස්තමේන්තුව ඇමරිකානු ඩොලර් මිලියන 529.06 ක් හෙවත් රු.මිලියන 74,325.75ක් විය. ව්‍යාපෘතිය 2008 වර්ෂයේ ආරම්භ කර වසර 07 කින් එනම් 2015 නොවැම්බර් 15 දින නිම කිරීමට මූලිකව අපේක්ෂා කර තිබුණි. උක්ත ව්‍යාපෘතියේ මූලස්ථායී වැඩ | | |

| | | | |
|---|---|---|---|
| | සඳහා 2023 දෙසැම්බර් 31 දිනට ඇමරිකානු ඩොලර් මිලියන 504.05 ක් වැඩ සහතික කොට ගෙවා තිබුණි. පහත නිරීක්ෂණයන් කෙරේ. | | |
| (i) | ව්‍යාපෘතිය සඳහා අරමුදල් ඉරාන අපනයන සංවර්ධන බැංකුව මගින් මූල්‍යනය කිරීමට යටත්ව තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කොන්ත්‍රාත්කරු තෝරාගෙන 2007 නොවැම්බර් 27 දින ගිවිසුමකට එළඹ තිබුණි. 2013 වර්ෂයේදී ඉරානය ආර්ථික සම්බාධක හේතුවෙන් අදාළ ප්‍රදානය කරන ලද ණය මුදල අත්හිටුවා තිබීම හේතුවෙන් විදේශීය ණය ගිවිසුම යටතේ ඇමරිකානු ඩොලර් මිලියන 50 ක් හෙවත් රු.මිලියන 6,522.85 ක් මූල්‍යනයෙන් අනතුරුව 2023 දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතියේ පිරිවැය වූ ඇමරිකානු ඩොලර් මිලියන 453.913 ක් හෙවත් රු.මිලියන 67,737,738 ක් ශ්‍රී ලංකා රජයේ අරමුදල් වලින් මූල්‍යකරණය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය දේශීය අරමුදල් මගින් ඉදිරියට ගෙන යාම පිළිබඳ තීරණය කිරීමේදී ජාත්‍යන්තර තරඟකාරී මිල ගණන් කැඳවීම තුළින් ශ්‍රී ලංකා රජයට ලබාගත හැකිව තිබූ තරඟකාරී වාසි පිළිබඳ තක්සේරු කිරීමක් සිදුකර අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර නොතිබුණි. | අනාගතයේදී මෙවැනි අන්තර්ජාතික කොන්ත්‍රාත් වල මෙවැනි තත්වයක් සිදුවුවහොත් එවැනි අවස්ථාවල තරඟකාරී මිල ගණන් කැඳවා භාණ්ඩාගාරයට හා විදේශ සංචිත වලට අවම බලපෑමක් වන පරිදි කටයුතු කිරීම සඳහා එකඟ වෙමි. ව්‍යාපෘතිය අවසාන අදියරේ පවතින මෙවන් අවස්ථාවක, තවත් අතිරේක පිරිවැයක් හා කාලයක් මිඩංගුකර අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීම ප්‍රතිඵලදායක වියහැකිද යන්න නිරීක්ෂණය කරමි. | ව්‍යාපෘතීන් හි ක්‍රියාකාරීත්වය තුළ ව්‍යුහාත්මක වෙනස්කම් හා තරඟකාරී වාසි පිළිබඳ තක්සේරු කර අමාත්‍ය මණ්ඩලය දැනුවත් කළ යුතුය. |
| (ii) | ව්‍යාපෘතිය වසර 7 ක් තුළ එනම් 2015 නොවැම්බර් 15 දිනට නිම කිරීමට නියමිතව පැවතියද 2023 දෙසැම්බර් 31 දින වන විට ප්‍රමාද කාලය වසර 8 ක් ඉක්මවා තිබුණි. ව්‍යාපෘතියෙන් අපේක්ෂා කල විදුලි බල ජනන පද්ධතියට මෙගාවොට් 120 ක විදුලි බලයක් එකතු කිරීම තුළින් දිනකට විදුලිබල මණ්ඩලයට රු. මිලියන 55 කට නොවැඩි මුදලක් ඉතිරිවන බව ගණන් බලා තිබූ අතර ඒ අනුව ව්‍යාපෘතිය වසර 8 ක් ප්‍රමාදවීම තුළින් සිදුව තිබූ පාඩුව රු.මිලියන 162,250 ක් වී තිබුණි. තවද මෙම ප්‍රමාදය හේතුවෙන් මොණරාගල දිස්ත්‍රික්කයේ | අනපේක්ෂිත හා නොවැලැක්විය හැකි හේතූන් නිසා (හදිසියේ ප්‍රධාන උමගේ ඇතිවූ ජල කාන්දුව, කොවිඩ් වසංගත තත්වය, 2021/2022 වර්ෂවල රටතුල ඇතිවූ ආර්ථික පසුබෑම හා විදේශ විනිමය ගෙවීමේ දුෂ්කරතාවය) සැලසුම්කර තිබූ පරිදි මූලික ඉලක්කයන් සපුරාගත නොහැකි විය. එම බලපෑම නිසා ලංකා විදුලි බල මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ඒ ඒ ආයතන වලින් ප්‍රතිලාභ ලබන්නන්ට අහිමි වූ ප්‍රතිලාභ වල වටිනාකම ගණනය කිරීම සිදුකල යුතුවේ. කෙසේ වුවද වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් මේ වන විටත් පහල නිම්නයේ වාරි පහසුකම් සැපයිය | ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමේදී ව්‍යාපෘති මූලික අරමුණු යටතේ හඳුනාගෙන ඇති ප්‍රතිලාභ ප්‍රමාද වීම හා ඒ සඳහා දැරීමට සිදු වන අතිරේක පිරිවැය පිළිබඳ විශ්ලේෂණයක් සිදු කර වාර්තා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වැල්ලවාය හා තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පිහිටි නව ඉඩම් හෙක්ටයාර 4,500 ක් හා දැනට වගා කෙරෙන ඉඩම් හෙක්ටයාර 1,500 ක් සඳහා වාරි ජලය සැපයීම, පානීය හා කර්මාන්ත සඳහා වාර්ෂිකව ඝන මීටර් මිලියන 30 ක ජලය සැපයීම, බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල සහ ඇටැම්පිටිය ප්‍රදේශවල පානීය ජල අවශ්‍යතා සැපයීම යන ප්‍රතිලාභ අත් කර ගැනීමට නොහැකි වී තිබුණි. | යුතු ඉඩම් කොටස් සඳහා ඇළ මාර්ග ඉදිකිරීම සම්පූර්ණ කොට නොමැති බැවින් සහ ජලසම්පාදන හා ජලපවහන මණ්ඩලය මගින් විසල් බණ්ඩාරවෙල ජල ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු අවසන් කිරීමට තවත් වසර 4 හෝ 5 පමණ කල්ගත වියහැකි බව දන්වා ඇති බැවින්, ව්‍යාපෘතිය ප්‍රමාදවීම නිසා ප්‍රතිලාභීන්ට සිදුවන බලපෑම ඉතා අවම මට්ටමක පවතී. කෙසේ වුවද, උමා ඔය ව්‍යාපෘතියේ ජලාශ වල වැඩ කටයුතු සම්පූර්ණ කර මේ වන විට (2024 අප්‍රේල් මස සිට) මෙ. වො. 120 ක ජල විදුලිය ජනනය කර ජාතික විදුලි බල පද්ධතියට එකතු කිරීම නිසා දිනකට රජයට ලැබෙන ලාභය රු. මිලියන සීයක් පමණ වේ. | |
| (iii) | ව්‍යාපෘති ප්‍රමාදය මගින් සේවායෝජක වන ශ්‍රී ලංකා ජනරජයට සිදුවී ඇති පාඩුව හා ඊට අදාළ ආවස්ථික පිරිවැය ගණනය කොට EPC කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාර කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමේ හැකියාව පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි. ව්‍යාපෘතියට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ 71 ක් ඉදිරිපත් කර තිබූ නමුත් එම කිසිදු අවස්ථාවකදී කොන්ත්‍රාත් ගිවිසුමේ 8.7 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 0.01ක් වශයෙන් උපරිමය සියයට 5 ක් දක්වා එනම් ඇ.ඩොලර් මිලියන 26.453 ක් ප්‍රමාද ගාස්තු ලෙස අයකළ හැකි බවට අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර නොතිබුණි. ප්‍රමාද ගාස්තුව ලෙස අයකරගෙන තිබුණේ ඇ.ඩොලර් 6,631,364ක් පමණක් වූ අතර අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි එම මුදලින් ඇ.ඩොලර් 5,305,091 ක් ආපසු කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | ඉහත හේතුන් නිසා ව්‍යාපෘති කාලය අනපේක්ෂිත ලෙස වසර 8 කින් පමණ ප්‍රමාදවූ බව සත්‍යයක් නමුත්, එසේ ප්‍රමාද වීමට බලපෑ හේතුන් සේවා යෝජක සහ කොන්ත්‍රාත්කරු විසින් එකඟතාවයකට පැමිණීමෙන් පසු කාල දිගු කිහිපයක් ලබා දී ඇති නිසා එම ව්‍යාපෘති ප්‍රමාද වූ කාල සීමාව සඳහා ආවස්ථික පිරිවැය ගණනය කිරීම ප්‍රායෝගික නොවන අතර කොන්ත්‍රාත් පරිපාලනය තුල එවැනි ගණනය කිරීමක් කර අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීම සම්ප්‍රදාය නොවේ. | අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීම ගිවිසුමේ කොන්දේසි ප්‍රකාර කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට පිළිබඳ තොරතුරු අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කළ යුතුය. |
| (iv) | මෙම ව්‍යාපෘතියේ ගිවිසුම් කාලය දීර්ඝ කිරීම සඳහා 2023 ජනවාරි 08 දින වාරිමාර්ග අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් ව්‍යාපෘතිය නිම කිරීම සඳහා වූ කාලය 2023 ජුනි 30 දින දක්වා යෝජනා කර තිබුණි. ඒ සඳහා මුදල් ඇමතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ 2023 ජනවාරි 16 දිනැති නිරීක්ෂණ | කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව කාලය දීර්ඝ කිරීම සඳහා ඉල්ලුම් කිරීමේදී සෑම අවස්ථාවකදීම කොන්ත්‍රාත් වටිනාකමේ කිසිදු වෙනසක් සිදු නොවීම නිසා, කිසිදු අතිරේක පිරිවැයක් පැන නොනගී. ඒ අනුව, එවැනි පිරිවැයක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීම පිලිබඳව ඔවුන්ව දැනුවත් කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගී<br>උක්ත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ මුදල්, | කාලය දීර්ඝ කිරීමට පෙර ප්‍රමාදවීමේ ආවස්ථික පිරිවැය ගණනය කර ගිවිසුම් ප්‍රකාරව අයකර ගැනීම කළ යුතුය.<br>අමාත්‍ය මණ්ඩල තීරණය අනුකූලව ප්‍රමාද කාලය සඳහා |

| | | | |
|---|---|---|---|
| | අනුව කටයුතු කිරීමට යටත්ව අනුමැතිය ලබා දී තිබූ අතර ව්‍යාපෘතිය දිගින් දිගටම ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රමාද වන දිනක් පාසාම ජාතික විදුලිබල පද්ධතියට දෛනික 120MW විදුලිබල ප්‍රමාණයක් එකතු කිරීමට නොහැකි වන හෙයින් ලංකා විදුලිබල මණ්ඩලයට බාහිර පාර්ශවයෙන් විදුලිය මිලදී ගැනීමට දිනකට රුපියල් මිලියන 100 ක් පමණ අමතරව වැය කිරීමට සිදු වන බැවින් කොන්ත්‍රාත්කරු විසින් 2023 ජූනි 30 දිනට ව්‍යාපෘතිය අවසන් කිරීමට අපොහොසත් වන්නේ නම් එම දිනෙන් පසුව ගත වන දිනයක් පාසාම කොන්ත්‍රාත්කරුගෙන් නිසි වන්දියක් ලබා ගැනීමට හැකි වන පරිදි ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමේ ගිවිසුම සකස් විය යුතු බවට මුදල් අමාත්‍යවරයා යෝජනා කර තිබුණි. එසේ වුවද ඊට අනුකූලව ගිවිසුම සකස් කිරීමකින් තොරව අමාත්‍ය මණ්ඩල තීරණය නොසලකාහරිමින් ව්‍යාපෘති කාලය දීර්ඝ කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. තවද අමාත්‍ය මණ්ඩල තීරණ අනුව රජයට අමතර වැය බරක් නොමැතිව දීර්ඝ කරනු ලබන කාලය තුල ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් කල යුතු බවට නියම කර තිබූ බැවින් EPC කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධානයන්ට අනුකූලව කාලය දීර්ඝ කිරීම හේතුවෙන් පැන නගින පිරිවැය කොන්ත්‍රාත්කරු විසින් දරා ගත යුතු බව හා නියමිත දිනට ව්‍යාපෘතිය නිම නොකිරීම හේතුවෙන් පැන නගින ආවස්ථික පිරිවැය අය කර ගැනීමට සිදු වන බව කොන්ත්‍රාත්කරු වෙත දැනුම් දිය යුතුව තිබූ නමුත් එසේ සිදු කර නොතිබුණි. | ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වරයාගේ නිරීක්ෂණ වල අවසාන ඡේදයේ සඳහන් කර ඇති පරිදි " කොන්ත්‍රාත්කරු වෙත ඉහත කාල සීමාවේදී සිදු කල යුතු සියලුම ගෙවීම් සිදු කිරීමෙන් පසුව 2023.06.30 දිනට කොන්ත්‍රාත්තුවේ වැඩ නිම කිරීමට අපොහොසත් වන්නේ නම් පමණක් ඔහුගෙන් නිසි වන්දියක් අයකර ගැනීමට හැකිවන පරිදි ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමේ ගිවිසුම සකස්කල යුතු බව" ප්‍රකාශ වේ. එහෙත් එදින වන විට රටතුල පැවති විදේශ විනිමය හිඟතාවය, ඉන්ධන අර්බුධය, අමුද්‍රව්‍ය හිඟතාවය සහ භාණ්ඩාගාරයෙන් නිසි වේලාවට අරමුදල් නොලැබීම නිසා සේවා යෝජක පාර්ශවයෙන්, කොන්ත්‍රාත්කරු සඳහා ගෙවීමට නියමිත මුදල් සම්පූර්ණ වශයෙන් ලබා දීමට නොහැකි විය. එම නිසා එවැනි කොන්ත්‍රාත්කරුගෙන් අයකිරීමක් හෝ කාලය දීර්ඝ කිරීමේ සංශෝධිත ගිවිසුමක් අත්සන් කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනැගිනි. | ගණනයට විධිමත් ක්‍රමවේදයක් සකස් කර කොන්ත්‍රාත්කරුගේ එකගතාවය මත අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (v) | කොන්ත්‍රාත්කරු විසින් 2023 ජුලි මස ඉදිරිපත් කර තිබූ දෙවන හිමිකම්පෑමේ බිල්පත මගින් කාලය දීර්ඝ කිරීමට අදාළ හේතු 8 ක් සඳහා ඇමරිකානු ඩොලර් 105,159,108 ක් ඉල්ලුම් කර තිබුණි. ඒ තුළ 2020 දෙසැම්බර් සිට 2023 ජුලි දක්වා දීර්ඝ කල කාල සීමාව වෙනුවෙන් පුද්ගල පිරිවැය ඇමරිකානු ඩොලර් 56,152,590 ක් හා | කොන්ත්‍රාත් පරිපාලනය කිරීමේදී අන්තර් ජාතික ගිවිසුම් කොන්දේසි (FIDIC) හා අමාත්‍ය මණ්ඩල තීරණ වලදී පනවා තිබූ සීමාවන් කිසිම අවස්ථාවකදී උල්ලංගනය කිරීමක් හෝ බැහැරව කටයුතු කිරීමක් සිදු කර නොමැති බව ප්‍රකාශ කරනු කැමැත්තෙමි. | අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමේදී නිවැරදි තොරතුරු ඇතුළත් කිරීමට වගබලා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | යන්ත්‍රෝපකරණ පිරිවැය ඇමරිකානු ඩොලර් 4,555,841 ක් ද 2020 මාර්තු 21 සිට 2020 ජුනි 15 දක්වා දීර්ඝ කල කාලසීමාව වෙනුවෙන් පුද්ගල පිරිවැය ලෙස ඇමරිකානු ඩොලර් 10,402,273 ක් හා යන්ත්‍රෝපකරණ පිරිවැය ලෙස ඇමරිකානු ඩොලර් 403,089 ක් ද ඇතුළත්ව පැවතුණි. එහිදී FIDIC අන්තර්ජාතික ගිවිසුම් කොන්දේසි හා අමාත්‍ය මණ්ඩල තීරණයන් මගින් පනවා තිබූ සීමාවන් නොසලකා කොන්ත්‍රාත් පරිපාලන කටයුතු මෙහෙයවා තිබූ අතර මෙම හිමිකම් පෑම පිළිබඳ තොරතුරු හෝ කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද ගාස්තු අය කර ගැනීම පිළිබඳ උක්ත සංදේශය තුළ දක්වා නොතිබුණි. | | |
| (vi) | ව්‍යාපෘතියේ ප්‍රමාදයන් සඳහා කොන්ත්‍රාත්කරු ප්‍රමාද ගාස්තු හිමිකම වශයෙන් ඇමරිකානු ඩොලර් 181,337,171 ක ප්‍රමාද ගාස්තුවක් ඉල්ලා තිබුණි. මේ පිළිබඳ සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් නිලධාරීන් 7 දෙනෙකුගෙන් සමන්විත සාකච්ඡා සම්මුති කමිටුවක් පත් කර තිබූ අතර එම කමිටුව විසින් මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු විසින් ගණනය කර ඉදිරිපත් කරන ලද ඇමරිකානු ඩොලර් 181,337,171 ක ප්‍රමාද ගාස්තුව වෙනුවට, ඇමරිකානු ඩොලර් 19,517,082 ක ප්‍රමාද ගාස්තුවක් නිර්දේශ කර තිබුණි. ඉරාන රජයට පනවා තිබූ ආර්ථික සම්බාධක හා වෙනත් දුෂ්කරතා හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් මුහුණ දෙනු ලබන මූල්‍යමය බාධාවන් සඳහා සානුකම්පිත හේතූන් මත අමාත්‍ය මණ්ඩලයේ කැමත්ත පරිදි, ඇමරිකානු ඩොලර් 19,094,795 ක අමතර ගාස්තුවක් ගෙවීමට ද නිර්දේශ කර තිබුණි. ඒ අනුව ඇ.ඩොලර් මිලියන 38.62 ක් ප්‍රමාද ගාස්තු ලෙස ගෙවීමට කමිටුව නිර්දේශ කර අර්ථ ගන්වමින් අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර තිබුණි. | මෙම නිරීක්ෂණය සමඟ එකඟවේ. දැනටමත් විදුලිබල මණ්ඩලය වෙත ලබාදුන් මුදලින් ඉහත හිමිකම් සඳහා ඇ.ඩො. මිලියන 19.071ක් (රු. මිලියන 5,481.79) මේ වන විට ගෙවා ඇත. | ප්‍රමාද ගාස්තු හිමිකම සොයා බලා ගණනය කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (vii) | කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරිමේදී "රජය වෙත අමතර වියදමකින් තොරව දීර්ඝ කරන ලද කාල සීමාව තුළ සියලු ඉදි කිරීම් නිම කර ව්‍යාපෘතිය විධිමත්ව රජය වෙත භාර දීම" යන කොන්දේසිය පනවා තිබූ නමුත් එම කොන්දේසිය පිළිබඳව සැලකිල්ලක් දක්වා නොතිබීම, කමිටු නිර්දේශය තුළ සානුකම්පිත හේතූන් මත අමාත්‍ය මණ්ඩලය කැමැත්ත මත ඇමරිකානු ඩොලර් 19,094,795 ක අමතර ගාස්තුවක් ගෙවීමට නිශ්චිත නොවූ හා වෘත්තීමය භාවිතයෙන් තොර නිර්දේශ ඇතුළත් කර තිබුණි. | මෙම නිරීක්ෂණයද නිවැරදිවේ. මෙම මුදල දෝෂ නිවැරදි කිරීමේ කාලය (Defects Liability Period) අවසානයේදී ලංකා විදුලි බල මණ්ඩලය විසින් ගෙවිය යුතු මුදලකි. | අමතර ගාස්තු හිමිකම සොයා බලා ගණනය කල යුතුය. |
| (viii) | ව්‍යාපෘතියේ ප්‍රතිස්ථාපන මාර්ගයේ මුල් සැලසුමට ඇතුළත් කර තිබූ පුහුල්පොළ වේල්ල ඉදිකිරීමේ පූර්ව අවශ්‍යතාවයක්ව පැවති බදුල්ල, වැලිමඩ මාර්ගයේ පවතින පැරණි මාර්ගයේ මීටර් 250 ක් අමතරව දීර්ඝ කර නිම කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් තම විෂය පථයෙන් බැහැරව යමින් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කල රු.133,476,320 ක ඇස්තමේන්තුව අනුමත කර තම ඉන්වොයිස් වලින් අඩු කර ගෙවීමට කැමැත්ත පලකර තිබුණි. ඒ අනුව එම මාර්ගය සකස් කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියට භාරදීමට යොජනා කර තිබුණ ද, මාර්ගය සකස් කර නොතිබුණු අතර පුහුල් පොළ වේල්ල වැඩ බිම ප්‍රවේශ මාර්ගය හා නව මාර්ගය සකස් කිරීම සඳහා ඇමරිකානු ඩොලර් 1,514,094 ක් ඇස්තමේන්තු කර ඉන් ඇමරිකානු ඩොලර් 115,156 ක්ද ගෙවා තිබුණි. | පුහුල්පොල By pass Road හි තවමත් ඉදිකිරීමට ඉතිරි මීටර් 250 ක්වූ කොටස ඉදිරියේදී මාර්ග සංවර්ධන අධිකාරියට භාරදීමට යෝජනා කර ඇති අතර මේ සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත්කර ඇත.<br>ශ්‍රී ලංකා මාර්ග සංවර්ධන අධිකාරියට අයත් A05 මාර්ගයේ (පේරාදෙණිය, වැලිමඩ, බදුල්ල, චෙන්කලාඩි මාර්ගයේ) කි.මීටර් 93 කණුව සහ 95 කණුව අතර කි.මීටර් 1.9 ක කොටසක් පුහුල්පොල වේල්ල ඉදිකිරීම සඳහා අත්පත් කරගැනීමට සිදුවූ හෙයින්, එම මාර්ගයේ වාහන ගමනාගමනය පවත්වා ගැනීම සඳහා නව මාර්ග කොටසක් (By pass Road) ඉදිකිරීමට සිදුවිණි. කොන්ත්‍රාත්කරු වන ඉරානයේ හි Farab Company (FC) විසින් බදුල්ල දෙසටවූ, ඉහත සඳහන් මාර්ගය නැවත ඉදිකිරීමට අමතරව පිහිටි මාර්ගයේ, වැඩි දියුණු කිරීමට එකඟ වී ඇති මීටර් 250 ක දුරක් හැර මෙම මාර්ගයේ ඉදිකිරීම සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත. එසේ සම්පූර්ණ කරන ලද මාර්ග කොටස මේ වන විට ශ්‍රී ලංකා මාර්ග සංවර්ධන අධිකාරිය වෙත විධිමත්ව භාර දී භාවිතයේ පවතී.<br>ශ්‍රී ලංකා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබාදී ඇති ඇස්තමේන්තු මුදලේ බදු රහිත අගය වන රු. 110,709,836 මුදල ඔවුන්ගේ ගෙවීම් වවුචර වලින් අඩුකර ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කර ඇත.<br>තවද පුහුල්පොල වේල්ල වැඩබිම ප්‍රවේශ මාර්ගය හා කි.මී.1.98 ක් වූ නව මාර්ගය | මූලික සැලැස්මෙන් පරිබාහිරව කොන්ත්‍රාත්කරු විසින් කරන ලද ඉදිකිරීම් වෙනුවෙන් ගෙවීම් කරන ලද නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සකස් කිරීමට ඇමරිකානු ඩොලර් 1,514,094 ඇස්තමේන්තුකර තිබූ අතර පුහුල්පොල වේල්ල වැඩබිම ප්‍රවේශ මාර්ගය මේ වන විට ඉදිකිරීම් නිමකර ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට භාරදී ඇත. ඊට අදාල මුලු මුදල ඇමරිකානු ඩොලර් 115,156 කොන්ත්‍රාත්කරුට ගෙවා ඇත. නව මාර්ගයේ මේ වන විට කොන්ත්‍රාත්කරු විසින් නිමකර ඇති දුරට (කි.මී.1.73) අදාල මුදල වන ඇමරිකානු ඩොලර් 1,202,667 ඔහුට මේ වන විට ගෙවා ඇති අතර එම කොටස RDA ට බාරදී ඇත. | |
| (ix) | ව්‍යාපෘතියේ ප්‍රධාන උමගෙහි ඇති වූ ජල කාන්දුව සඳහා වන්දි වශයෙන් කොන්ත්‍රාත්කරු විසින් අදාළ රක්ෂණ සමාගමෙන් ඇමරිකානු ඩොලර් 5,000,000 ක වන්දියක් ලබාගෙන තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් වින්දිත පාර්ශව වෙත ගෙවිය යුතු වන්දි වෙනුවෙන් 2021 අගෝස්තු 31 වන විට රජයේ මුදලින් රු.1,931,346,396 ක් ගෙවා තිබූ අතර රජයෙන් ගෙවූ වන්දි මුදල් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගත යුතු බවට 2019 මැයි **22** දින ගිණුම් කාරක සභාව විසින් නියෝග කර තිබූ නමුත් ඉන් රු.මිලියන 1,124.62 ක් විගණිත දිනය දක්වාම අය කර ගෙන නොතිබුණි. ඔවුන්ගෙන් අයකර ගත් මුදල නැවත ගෙවන ලෙස කොන්ත්‍රාත්කාර සමාගම විසින් ඉල්ලීමක් සිදු කර තිබුණි. තවද බලපෑමට ලක් වූ ජනතාව වෙත ගෙවන ලද වන්දි මුදල් හා පානීය ජලය සැපයීම වෙනුවෙන් සමාගම විසින් දරා ඇති ඇමරිකානු ඩොලර් මිලියන 6.108 ක වියදම ද ලබා දෙන ලෙස සමාගම ව්‍යාපෘතියෙන් ඉල්ලා තිබුණි. | ව්‍යාපෘතියේ ප්‍රධාන උමගේ ඇතිවූ ජල කාන්දුව සඳහා වන්දි වශයෙන් ශ්‍රී ලංකා රජය විසින් කොන්ත්‍රාත්කරු වෙනුවෙන් ගෙවාතිබූ රු. මිලියන 1,931.34ක මුදලින් විගණිත දිවය වන විටත් රු.මිලියන 1,124.62 ක් අයකරගෙන නොතිබුණි. එසේම, මේ දක්වා කොන්ත්‍රාත්කරුගෙන් අයකරගෙන තිබූ මුදල නැවත ඔවුන් වෙත ආපහු ගෙවන ලෙසද ඉල්ලීමක් කර තිබුනි. ඊට අමතරව කොන්ත්‍රාත්කරු විසින් වන්දි ගෙවීම හා පානීය ජලය සැපයීම වෙනුවෙන් දරා ඇති මුදල වන ඇ. ඩො. මිලියන 6.108 ක වියදම ප්‍රතිපූර්ණය කරන ලෙසද ඉල්ලීමක් කර ඇත. විගණන නිරීක්ෂණ සමග එකඟවෙමි. | රජයෙන් ගෙවූ වන්දි මුදල් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගත යුතු බවට ගිණුම් කාරක සභාව විසින් ලබාදුන් නියෝග ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (x) | වාරිමාර්ග අමාත්‍යවරිය විසින් 2024 පෙබරවාරි 05 දින ඉදිරිපත් කර තිබූ අංක අමප/24/0044/623/002 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලබාදුන් අමාත්‍ය මණ්ඩල තීරණය මගින් උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ඇමරිකානු ඩොලර් මිලියන 514 ක පිරිවැයක් දරා නිම | මේ වන විට (2024.08.05) ව්‍යාපෘතියේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු බාරගන්නා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත පුහුල්පොල ජලාශය සහ ආශ්‍රිත ඉඩම් සහ ඩයරබා ජලාශය සහ ආශ්‍රිත ඉඩම් සහ සම්බන්ධිත උමග (Link Tunnel) බාරදී ඇත. එසේම භූගත විදුලි බලාගාරය සහ Switch Yard, ඩයරබා අලිකොටාර ප්‍රධාන උමං මාර්ගය | අදාල වත්කම් හා ලේඛණ ෆරාබ් සමාගමෙන් ව්‍යාපෘති කළමණාකරණ ඒකකය වෙත භාර ගෙන අදාළ ආයතන වලට භාර දීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කරන ලද ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2024 මාර්තු 31 දිනට අවසන් කිරීමත් සමඟ ව්‍යාපෘති කළමණාකරණ ඒකකය මඟින් ව්‍යාපෘතිය නඩත්තු කරන ලංකා විදුලිබල මණ්ඩලය හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යන ආයතන වෙත එහි මෙහෙයුම් කටයුතු භාර දී වත්කම් හා ලේඛණ භාරදීම සිදු කල යුතුව පැවතුණද අදාල වත්කම් හා ලේඛණ ෆරාබ් සමාගමෙන් ව්‍යාපෘති කළමණාකරණ ඒකකය භාර ගෙන අදාළ ආයතන වලට භාර දීමට කටයුතු කර නොතිබුණි. | (15KM HR Tunnel), Switch Yard/ Badulla Transmission Line යන වත්කම් දැනටමත් භෞතිකව ලංකා විදුලි බල මණ්ඩලය වෙත බාරදී ඇත. එහෙත් තවදුරටත් අවසන් කිරීමට සුළු වැඩ කොටස් තිබෙන නිසා දෝෂ නිවැරදි කිරීමේ කාලය අවසානයේදී අවසන් පිරිවැය ගණනය කිරීමෙන් පසුව ඒ ඒ ආයතන දෙකට වත්කම් වල මූල්‍ය වටිනාකම් බාරදීමට කටයුතු කරනු ඇත. | |
| (xi) | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC) වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශය විසින් පත් කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කරන ලෙස නිර්දේශ කර තිබුණි.ඒ අනුව FARAB සමාගම සමඟ ඇති කර ගත් ගිවිසුම් කාලසටහන සංශෝධනය කිරීම හා ව්‍යාපෘති අධ්‍යක්ෂ ද ඇතුළුව ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අවම කාර්යමණ්ඩලයෙහි සේවා කාලය දීර්ඝ කිරීම" යන මැයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබුණද එහිදි 2023 ජුනි 30 දිනෙන් පසුව ගත වන දිනයක් පාසාම කොන්ත්‍රාත්කරුගෙන් නිසි වන්දියක් ලබා ගත යුතු බවට ඉකුත් අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධව කිසිදු සඳහනක් කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුගෙන් වන්දියක් අයකර ගැනීමේ ගිවිසුමකට එලබීමේ අවශතාවයක් පැන නොනැගුන නිසා මෙම අමාත්‍ය මණ්ඩල සංදේශයේ ඒ පිළිබඳව නැවත සඳහන් කිරීමක් සිදුකර නොමැත. | අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමේදී නිවැරදි තොරතුරු ඇතුළත් කිරීමට වගබලා ගත යුතුය. |
| (ඇ) | මාදුරුඔය දකුණු ඉවුරු ඇල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 38,500.90 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර ප්‍රධාන ඇල ඇතුළුව සංවර්ධන කාර්යන් 14 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. | | |
| (i) | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2021 සිට 2023 දක්වා රු. 1,689,000,000 ක ප්‍රතිපාදන වෙන්කර ඉන් රු.836,104,531 ක් හෙවත් සියයට 50 ක් පමණක් වැයකර ඇතත්, ප්‍රමුඛතා පදනම මත ඉටුකල යුතු | දම්මින්න වලමන්ඩිය මාර්ගය 0+630 Km සිට 3+400 Km දක්වා කොටස ව්‍යාපෘති භූමිය වෙත ප්‍රවේශ වීමේ ප්‍රධානතම හා කෙටිම මාර්ගය වේ. කොන්ත්‍රාත් අංක MORBDP/Con/Rd/2021-11 යටතේ වැඩිදියුණු කල කොටස භාවිතයට ගත | ප්‍රමුඛතා පදනම මත ඉටුකල යුතු කාර්යන් හඳුනාගෙන ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර වැඩ අවසන් කළ යුතුය. |

කාර්යන් හදුනාගෙන ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර ක්‍රියාත්මක වී නොතිබුණි. එහිදී ප්‍රධාන ඇල මාර්ගය සඳහා ප්‍රමුඛතාවය ලබා දීමකින් තොරව රු.මිලියන 7,475 ක ඇස්තමේන්තු මත පාලම් ඇතුළු ප්‍රධාන වෙලඳපොල මාර්ගය ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. ඒ යටතේ දම්මින්න සිට වලමන්ඩිය දක්වා මාර්ගය කිලෝමීටර් 0+630 සිට කිලෝමීටර් 4+030 දක්වා කොටස වැඩිදියුණු කිරීම රු.93,459,575 ක ඇස්තමේන්තුව 2021 ජුලි 30 දින ආරම්භ කර තිබූ අතර 2023 සැප්තැම්බර් වන විට වැට් බදු ඇතුළුව රු.82,985,198 ක පිරිවැයක් දරා තිබුණි. උක්ත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේදී නිසි සැලැස්මකින් තොරව මාර්ගයේ තැනින් තැන කි.මි. 3.4 ක් කැනිම් කර තිබුණි.

නොහැකි මට්ටමට කැඩී ගොස් තිබුණි.වාරිමාර්ග අමාත්‍යාංශය 2021, 2022, 2023 වර්ෂ සඳහා රු. මිලියන 1,000 , 4000, 4000 බැගින් වෙන් කරන ලදී. ඒ අනුව ඒකක 01 ඉදිකිරීම් සියල්ලම නිම කිරීමට සැලසුම් කරන ලදී. ඊට සමගාමීව ව්‍යාපෘතියට ප්‍රවේශ වන මාර්ගය භාවිතයට ගත හැකි වන සේ වැඩිදියුණු කල යුතුව තිබුණි.මෙම මාර්ගය නවීකරණය කිරීම 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර තිබුණි.. අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (තාක්ෂණ සේවා) ගේ අනුමැතියට යටත්ව කොන්ත්‍රාත් ප්‍රදානය 2021.07.16 දින සිදු කර 2021 ජුලි 28 වැනි දින ආරම්භ කරන ලදී. 2021 Covid වසංගතය හා ඩීසල් සහ තාර ආශ්‍රිත නිෂ්පාදන වෙළඳපොලේ හිඟය හේතුවෙන් 2022 මාර්තු මාසයේ සිට කොන්ත්‍රාත් කටයුතු වලට බාධාවන් ලිඛිතව දැනුම් දෙන ලදී. ඉදිකිරීම් ද්‍රව්‍ය වෙළඳපළ නොතිබීම, ඉන්ධන හිඟය ආරම්භයේ සිට දින 159 ට වඩා කාලයක් සියලුම වැඩ අවස්ථා කිහිපයකදී නවතා දමා ඇත. එබැවින් කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවල 20.6 වගන්තිය සහ 2022 අප්‍රේල් 26 දිනැති 03/2022 ජාතික අයවැය චක්‍රලේඛය අනුව අන්‍යෝන්‍ය (විකල්ප) අවසන් කිරීම නිර්දේශ කරන ලදී.මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2022 දෙසැම්බර් 14 වැනි දින අන්‍යෝන්‍ය වශයෙන් ගිවිසුම අවසන් කරන ලදී. එමෙන්ම අතිරේක වැඩ, අමතර වැඩ හා අත්හළ වැඩ (deleted works) වල ශුද්ධ වටිනාකම (net variation) රු. 4,944,744.63 කි. ඒ සඳහා අනුමැතිය ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් 2022.09.14 දින ලබා දී ඇත.

එමෙන්ම කොන්ත්‍රාත් ප්‍රධානයේ මිල වැඩිවීම් සඳහා කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 7 ක ප්‍රමාණයක් වෙන් කල තිබුනද, පැවතී තත්වය අනුව කොන්ත්‍රාත් ගිවිසුමට අනුව සිදු කල වැඩ සඳහා සම්පූර්ණ මිල වැඩිවීම රු. 12,067,706 ක් විය. මේ සඳහා අමාත්‍යාංශ අතිරේක ලේකම් (තාක්ෂණ හා ප්‍රසම්පාදන) ලබා ගත් අනුමැතියට අනුව ගෙවීම් කරන ලදී.

| | | | |
|---|---|---|---|
| (ii) | රු.93,459,575 ක් පිරිවැය යටතේ දම්මින්න වලමණ්ඩිය මාර්ගය කිලෝමීටර් 0+630 Km සිට 3+400 Km දක්වා කොටස කාපට් ඇතිරිමට ඇස්තමේන්තුවක් අනුඥාත කර තිබුණි. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් වැලි කැනීම් බලපත්‍ර ලබාදුන් ස්ථානයන්ට ප්‍රවේශ වීමේ පහසුව අරමුණු කරගෙන මෙම මාර්ගය ඉදිකිරීමට ප්‍රමුඛතාවය ලබාදී තිබුණි.එහිදී දම්මින්න වලමන්ඩිය මාර්ගය කාපට් දමා සංවර්ධනය කිරීමට සැලසුම් කර තිබූ නමුත් එහි ABC දැමීමෙන් පසු කාපට් ඇතිරීම වෙනුවට තාර ස්ථරයක් දමා ඉදිකිරීම් අතරමග නවතා තිබුණු අතර ඒ වන විට මුළු පිරිවැය රු.45,241,775 ක්වූ වැඩ කොටස් නිම කර නොතිබුණි. ඒ පිළිබඳ නොසලකා අන්‍යෝන්‍ය එකඟතාවය මත ගිවිසුම අවසන් කිරීමට කටයුතු කර තිබුණි | මාර්ගයේ වසරකට අඩු කාලයක් තුල පළුදු ඇතිවීම සම්බන්ධව වාරිමාර්ග අමාත්‍යාංශය 2021 -2023 ඇස්තමේන්තු පුරෝකථනය අනුව 2021, 2022, 2023 වර්ෂ සඳහා රු.මිලියන 1,000 , 4000, 4000 බැගින් වෙන් කරන ලදී. ඒ අනුව ඒකක 01 ඉදිකිරීම් සියල්ලම නිම කිරීමට සැලසුම් කරන ලදී. ඊට සමගාමීව ව්‍යාපෘතියට ප්‍රවේශ වන මාර්ගය භාවිතයට ගත හැකි වන සේ මෙම මාර්ගය නවීකරණය කිරීම 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර තිබුණි.එමෙන්ම මෙම මාර්ගයේ මැනුම් කටයුතු 2021 වර්ෂයේ මාර්තු මාසයේ දීත්, ඇස්තමේන්තු අනුමත කිරීම 2021.04.22 දිනදීත්, ටෙන්ඩර් කටයුතු සඳහා පුවත් පත් දැන්වීම 2021.05.01 දිනදීත් පළකර ඇත.<br>මෙම කොන්ත්‍රාත්තුව 2021 ජූලි 28 වැනි දින ආරම්භ කරන ලදී. 2021 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා Covid වසංගතය නිසා ඉදිකිරීම් කටයුතු වලට බාධා සිදු විය. ඩීසල් සහ තාර ආශ්‍රිත නිෂ්පාදන වෙළඳපොලේ හිඟය හේතුවෙන් 2022 මාර්තු මාසයේ සිට කොන්ත්‍රාත් කටයුතු වලට බාධා එල්ල විය. වරින් වර කොන්ත්‍රාත්කරු මෙම බාධාවන් ලිඛිතව දැනුම් දෙන ලදී. | සැලසුම් කළ පරිදි මාර්ගයේ වැඩ නිමකිරීමට කටයුතු කළ යුතුය. |
| (iii) | රු.82,985,198 ක් වැයකර කිලෝමීටර් 3.4 ක් වූ මෙම මාර්ගය ABC අතුරා අතරමග වැඩ නවතා තිබූ මාර්ග වසරකට අඩු කාලයක් තුල තැනින් තැන පලුදු වී තිබුණි. එසේ වුවද හානි පුනරුත්ථාපනය සඳහා තැන්පතුවක් හෝ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකරගෙන නොතිබූ අතර හානිය අයකරගෙන හෝ මාර්ගය ප්‍රතිසංස්කරණය කරද නොතිබුණි. | කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවල 20.6 වගන්තිය සහ 2022 අප්‍රේල් 26 දිනැති 03/2022 ජාතික අයවැය චක්‍රලේඛය අනුව අන්‍යෝන්‍ය (විකල්ප) අවසන් කිරීම නිර්දේශ කරන ලදී.මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2022 දෙසැම්බර් 14 වැනි දින අන්‍යෝන්‍ය වශයෙන් ගිවිසුම අවසන් කරන ලදී. සාමාන්‍යයෙන් ABC ඇතිරීමෙන් පසු Prime Coat ආවරණය කිරීම සිදු කරන අතර, ඉන් පසු Asphalt Concrete ආස්තරණය කල යුතුය. නමුත් ඉහත සඳහන් කල කරුණු වලට අනුව Asphalt Concrete ආස්තරණය සිදු කිරීමට නොහැකි විය. එම නිසා මෙම මාර්ගය පළුදු වීම වැළැක්විය නොහැකි ක්‍රියාවලියකි. මාදුරුඔය දකුණු ඉවුර ප්‍රදේශය තුල මෙන්ම, ඊට පරිභාහිරව ක්‍රියාත්මක වැලි ව්‍යාපෘති මගින් ඉවත් කරන වැලිද, වලමන්ඩිය යුද හමුදා කඳවුරේ රථද, ප්‍රවාහනය කරනුයේ මෙම මාර්ගය තුලය. එම තත්ත්වයන් යටතේ Prime Coat ආවරණය කිරීම පමණක් සිදු කෙරුණු මාර්ගයක් පළුදු ඇති වීම නොවැලැක්විය හැකි | හානි පුනරුත්ථාපනය සඳහා තැන්පතු ලබා ගැනීම නොකල නිලධාරීන්ට එරෙහිව විනයානුකූල කටයුතු කිරීමත් මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු කොන්ත්‍රාත්කරු ලවා ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කරුණකි.2023 වසරේදී මෙම ප්‍රවේශ මාර්ගයෙහි කාපට් ඇතිරීම සඳහා ඇස්තමේන්තු අංක 02 යටතේ ඉදිරිපත් කර ඇතත්,මෙම වැඩසටහන සඳහා RAMP කමිටුවේ අනුමැතිය නොලැබුණි. එබැවින් අදාළ වැඩ සම්පූර්ණ කිරීම නිසිපරිදි සිදු කිරීමට නොහැකි විය. | |
| (iv) | මාර්ගය ඉදිකිරීම සඳහා ගෙවීම් කිරීමේදී රු.7,258,698 ක අමතර වැඩ, රු.13,948,399 ක අතිරේක වැඩ හා රු. 12,067,706 ක මිල වැඩිවීම් සඳහා ද විධිමත් අනුමැතියකින් තොරව ගෙවීම් කර තිබුණි. | අතිරේක වැඩ, අමතර වැඩ හා අත්හළ වැඩ (deleted works) වල ශුද්ධ වටිනාකම (net variation) රු. 4,944,744 කි. ඒ සඳහා අනුමැතිය ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් 2022.09.14 දින ලබා දී ඇත.<br>එමෙන්ම කොන්ත්‍රාත් ප්‍රදානයේ මිල වැඩිවීම් සඳහා කොන්ත්‍රාත් වටිනාකමින් 7%ක ප්‍රමාණයක් වෙන් කල තිබුනද, පැවතී තත්වය අනුව කොන්ත්‍රාත් ගිවිසුමට අනුව සිදු කල වැඩ සඳහා සම්පූර්ණ මිල වැඩිවීම රු. 12,067,706 ක් විය. මේ සඳහා අමාත්‍යංශ අතිරේක ලේකම් (තාක්ෂණ හා ප්‍රසම්පාදන) ලිපිය මගින් අමාත්‍යංශ ලේකම්ගෙන් ලබා ගත් අනුමැතියට අනුව ගෙවීම් කරන ලදී. | විධිමත් අනුමැතියකින් තොරව ගෙවීම් සිදුකළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (v) | ගිවිසුමේ 7 වන කොන්දේසිය අනුව ගිවිසුමේ සඳහන් නියමිත කාලය තුල වැලි කැණීම් සිදු කිරීම පැහැර හැරියහොත් හෝ අපොහොසත් වුවහොත් ඒ සම්බන්ධයෙන් පළමු පාර්ශවයට සිදු වන හානිය සම්බන්ධයෙන් රු. 300,000 ක වන්දි මුදලක් පළමු පාර්ශවය වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ගෙවීමට දෙවන පාර්ශවය වන කොන්ත්‍රාත්කරු එකඟ වී තිබුණි. එහෙත් කොන්ත්‍රාත්කරුවන් **11** දෙනෙකු ගිවිසුම ප්‍රකාරව වැලි කැනීම් සිදුකිරීමට අපොහොසත් වී තිබූ නමුත් ඔවුන්ගෙන් අයවිය යුතු රු.3,300,000 ක වන්දි අයකර ගෙන නොතිබුණි. | වැලි ව්‍යාපෘති සඳහා මා විසින් අවසර ලබා දී තිබූ අතර එම ව්‍යාපෘති වල වන්දි මුදල් අයකිරීම සම්බන්ධයෙන් මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය වෙත සම්බන්ධයක් නොමැති අතර ඒ පිලිබදව ඉඩම් පරිහරණ හා සැලසුම් අංශය හා නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය - බී කලාපය වෙතින් පිළිතුරු ලබා ගත යුතුය. | අයවිය යුතු වන්දි කඩිනමින් අයකරගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 විදේශ ආධාර ව්‍යාපෘති**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මිණිපේ වම් ඉවුර හා දකුණු ඉවුර ඇළ මාර්ග සඳහා ජල පාලන හා මිනුම් පහසුකම් සහිතව මිණිපේ අමුණ එසවීමේ කොන්ත්‍රාත්තුව දින දීර්ඝ කිරීමෙන් තොරව වසර 02 කට ආසන්න | කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවල උප වගන්ති කිහිපයක් පමණක් සංශෝධනය කිරීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුමේ සංශෝධනය | සංශෝධිත ගිවිසුමේ කොන්ත්‍රාත්තු වටිනාකම ඇතුලත් නොකර ගිවිසුම |

| | | | |
|---|---|---|---|
| | කාලයක් පවත්වාගෙන ගොස් තිබූ අතර, මෙම කාලය තුළ කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 22 ක් විය.මෙම කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු. මිලියන 2,912.85 දක්වා වැඩිකර ඉතිරි වැඩ මුල් කොන්ත්‍රාත්කරු මඟින් ඉටු කරවා ගැනීමට සංශෝධිත ගිවිසුම් අංක 02 අත්සන් කිරීමටත්, කොන්ත්‍රාත් කාලය 2023 සැප්තැම්බර් 21 දින දක්වා වැඩි කිරීමටත් 2023 ජූනි 05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. ඒ අනුව අත්සන් කරන ලද සංශෝධිත ගිවිසුමේ කොන්ත්‍රාත්තු වටිනාකම ඇතුලත් නොකර ගිවිසුම අත්සන් කර තිබුණු අතර වැඩිකර තිබූ කොන්ත්‍රාත් වටිනාකම වූ රු.මිලියන 1,048.05 තුළ රු. මිලියන 996.10 ක්ම මිල විචලනයන් විය. | අංක 02 අත්සන් කරන ලදී. මුල් ගිවිසුමේ ලබා දී ඇති පිළිගත් කොන්ත්‍රාත් මුදල යන්නෙන් අදහස් වන්නේ වැඩ ක්‍රියාත්මක කිරීම සහ සම්පූර්ණ කිරීම සහ කිසියම් දෝෂයක් සඳහා පිළියම් යෙදීම සඳහා පිළිගැනීමේ ලිපියේ පිළිගත් මුදලයි කෙසේ වෙතත්, කොන්ත්‍රාත් මිල යනු උප වගන්ති 141 හි අර්ථ දක්වා ඇති මිල වන අතර එම මුදල එක් එක් සංශෝධනයේදී කොන්ත්‍රාත්තුවට අනුකූලව කරන ලද ගැලපීම් වන අතර එය ලේඛනගත කිරීමට අවශ්‍ය නොවේ. | අත්සන් කළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතු අතර වැඩිකර තිබූ කොන්ත්‍රාත් වටිනාකම වූ රු. මිලියන 1,048.05 තුළ වූ රු. මිලියන 996.10 ක මිල විචලනය ගණනය කිරීම හා එහි නීත්‍යානුකූල භවය නැවත සමාලෝචනය කල යුතුය. |
| (ආ) | මොරගහකන්ද ජලාශයේ සිට කි.මී. 6.225 ක් දුරට ඉදිකරන ඇළ මාර්ගයේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 64 ක්ව තිබියදී කොන්ත්‍රාත්කරුට ඇති වූ මූල්‍ය අවහිරතා මත කොන්ත්‍රාත්තුව තවදුරටත් කරගෙන යාමට නොහැකි වීම හේතුවෙන් 2021 ජූලි 13 දින කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධන සුරක්ෂණය මුදල් කර අලාභය අයකර ගැනීමට උත්සාහ දැරීමේදී කොන්ත්‍රාත්කරු පැවරූ නඩුවක් හේතුවෙන් එම මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. ඒ අනුව ලබා දුන් අත්තිකාරම් සුරක්ෂණයෙන් රු. මිලියන 185.89 ක්ද කාර්යසාධන සුරක්ෂණයේ වටිනාකම වූ රු.මිලියන 390.51 ක්ද මේ දක්වා අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | කොන්ත්‍රාත්තුව "අවලංගු" කිරීමක් කර නොමැති අතර කොන්ත්‍රාත්තුව “අවසන්" (Terminated) කර ඇත. ඊට අදාළ නඩුව සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති අතර එහි තීන්දුව ලැබෙනතුරු බලා සිටී. | නඩු තීන්දුව ලැබූ විගස රජයට වූ අලාභය කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) (i) | වයඹ ඇළ මාර්ගයේ නැබඩගහවත්ත සිට මහකිතුල පිවිසුම් උමඟ දක්වා කි.මී. 17+050 ක ඇළ ඉදිකරන විදේශ සමාගම විසින් අදාළ කොන්ත්‍රාත්තුව 2018-2021 කාලය තුළ නිම කළ යුතු වුවත් ඉදිකිරීම් සිදු කරන ප්‍රදේශවල ඉඩම් කොටස් පවරා ගෙන භූමියේ අයිතිය නිරවුල් කර භාරදීමට වසර 2½ ක කාලයක් ප්‍රමාද වීම නිසා 2023 දෙසැම්බර් 05 දක්වා අවස්ථා 04 කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. මෙම ප්‍රමාද වීම හේතුවෙන් වැට් බදු සහිතව රු.මිලියන 7,226.62 කට ලබා දී තිබූ කොන්ත්‍රාත්තුව රු.මිලියන15,154.74 දක්වා රු. මිලියන 7,928.12 කින් එනම්, සියයට 110 කින් වැඩි වී තිබුණි. 2022 වර්ෂයේ සිට ඇති වූ ආර්ථික හා මූල්‍ය අවපාතය හේතුවෙන් ඉදිකිරීම් ද්‍රව්‍යවල පිරිවැය ඉහළ යාම හේතු ලෙස දක්වමින් වෙන් කර තිබූ රු. මිලියන 162 ක මිල විචලනය රු. මිලියන 5,827.7 දක්වා වැඩි කර තිබුණි. | ඉහත සඳහන් ඉඩම් කොටස් අත්පත් කර ගැනීම අවසන් කර ඇති අතර, ඉදිකිරීම් කටයුතු ඉන් අනතුරුව කරගෙන ගොස් තිබුණි එකඟ වෙමි.<br>මිල විචලනය ගෙවීම් සඳහා කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි අනුව FIDIC සූත්‍රය භාවිතා කරන අතර, CIDA ආයතනය මඟින් මාසිකව නිකුත් කරන මිල දර්ශක මේ සඳහා භාවිතා කෙරේ. | ඉඩම් අත්පත් කර ගැනීම, ව්‍යාපෘතියේ ඉදිකිරීම් සැලසුම් හා මිල විචලනය ගණනය කිරීම නැවත සමාලෝචනය කල යුතුය. |
| (ii) | කොන්ත්‍රාත්තුවේ අතිරේක වැඩ හා ප්‍රමාණ වෙනස් වීම් සඳහා රු. මිලියන 540 ක් වෙන්කර තිබුණද එය රු.මිලියන 2,024.9 දක්වා රු. 1,484.9 කින් වැඩි කර තිබුණි. එහිදී මීටර් 13 ක් පළලට විවෘතව සකස් කිරීමට සැලසුම් කර තිබූ ඇළ මාර්ගය පසුව උපදේශක සමාගම විසින් මීටර් 10 ක් පළල ඇළ මාර්ග 02 ක් ලෙසට සංවෘතව කොන්ක්‍රීට් යොදා සකස් කිරීමට තීරණය කර ඒ අනුව සැලසුම් වෙනස් කිරීම හේතුවෙන් කොන්ක්‍රීට් ඝන මීටර් 45,425 ක් අතිරේකව යෙදීමට සිදුව තිබීම නිසා රු. මිලියන 1,245.54 ක් අතිරේකව වැය කිරීමට සිදුව තිබුණි. මෙහිදී උපදේශක සමාගමේ නිර්මාණ සැලසුම් කිරීම අභියෝගයට ලක්ව තිබුණි. 2023 දෙසැම්බර් 05 දක්වා පමණක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණත්, 2023 දෙසැම්බර් 31 දිනටද කොන්ත්‍රාත්තුව නිමකර නොතිබූ අතර එදිනට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 91.4 ක් විය. | අතිරේක ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ තවදුරටත් ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා සහ ඇතිවිය හැකි පොදු මහජන නොසන්සුන්තාව වළක්වා ගැනීම සඳහා, සැලසුම් නිර්ණායක වෙනස් කිරීමට සිදු විය.කොන්ත්‍රාත්කරු 2023 සැප්තැම්බර් මස සිට 2023 දෙසැම්බර් මස දක්වා අයහපත් කාලගුණික තත්ත්වයෙන් පීඩා විඳි අතර, ඒ අනුව 2024 මැයි 17 දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සඳහා හිමිකම් ලබා ඇත. | මෙහි සැලසුම් නිර්මානය කල උපදේශක සමාගමේ නිර්මාන සැලසුම් නැවත සමාලෝචනය හා ගෙවීය යුතු ගාස්තු පරික්ෂාකර ගෙවිය යුතුය. මූලික සැලැස්මට අනුව කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන්කර එහි ප්‍රතිලාභ මහජනතාවට ලැබෙන පරිදි කටයුතු කල යුතුය. |
| (iii) | මෙම කොන්ත්‍රාත්තුව යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් දේවහුව ඉංජිනේරු කාර්යාලය අළුත්වැඩියාව සහ නවීකරණය කිරීම සඳහා රු. මිලියන 10 ක මුදලක් වෙන් කර තිබූ අතර, එය ඉටු නොකර එම මුදලින් රු. මිලියන 9.6 ක් වැයකර ව්‍යාපෘතියේ උපදේශක සමාගම සඳහා දෙමහල් නිවසක් කුලී පදනම මත ලබාගෙන තිබුණි. | කෙසේවෙතත්, කොන්ත්‍රාත්තුවේ මූලික අදියරේදී දේවහුව වාරිමාර්ග දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පරික්ෂා කරන ලද අතර, එය අලුත්වැඩියා කළ හැකි තත්ත්වයේ නොතිබූ බැවින්, ඉතා කෙටි කාලයකදී තෝරාගත් විකල්පය වූයේ ව්‍යාපෘතිය සඳහා | මූලික සැලැස්මට පටහැනිව ක්‍රියා කල නිලධාරින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වඩාත්ම මධ්‍යගතව පිහිටි ගොඩනැගිල්ලක් කුලියට ගැනීම සහ එහි නේවාසික ඉංජිනේරු කාර්යාලය පිහිටුවීම වේ. | |
| (ඇ) | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන් සඳහා උපදේශන සේවා ලබාගැනීම සම්බන්ධව පහත නිරීක්ෂණ කෙරේ. | | |
| (i) | මෙම වැඩසටහන සූදානම් කිරීමේ තාක්ෂණ සහාය (PPTA) සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් පත්කළ කණ්ඩායමේ ප්‍රධානියා පසුව මෙම වැඩසටහනේ උපදේශන සමාගමේ සේවයට බැඳී ව්‍යාපෘතියේ කණ්ඩායම් නායක හා ප්‍රධාන සැලසුම් ඉංජිනේරු ලෙස වසර 07 ක කාලයක් සේවය කරමින් පැවතුණි. ඒ සඳහා මසකට යුරෝ 26,000 ක (රු.මිලියන 8.5) වැටුපක් ගෙවූ අතර, 2023 ජූනි වනවිට රු. මිලියන 702.18 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. ආසියානු සංවර්ධන බැංකුව වෙනුවෙන් වැඩසටහන සූදානම් කිරීමේ කාර්යයන් ගණනාවකට සහාය වූ පුද්ගලයෙකු වැඩසටහනේ උපදේශන සමාගමේ සේවය කිරීම තුළින් වැඩසටහන් සුපරීක්ෂණයේ ස්වාධීනත්වය අභියෝගයකට ලක්ව තිබුණි. මෙම උපදේශකවරයාගේ සේවය ලබා ගැනීම ආසියානු සංවර්ධන බැංකුව 2013 වර්ෂයේ නිකුත් කල උපදේශකවරුන් යොදා ගැනීම සඳහා වූ අත්පොතෙහි 1.11 ඡේදයටද පටහැනි විය. | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන සඳහා සූදානම් කිරීමේ තාක්ෂණ සහය (PPTA) සකස් කිරීමට ආසියානු සංවර්ධන බැංකුව විසින් පත් කල කණ්ඩායමකට ලබා දී එම කණ්ඩායම විසින් අදාල වාර්තාව ආසියානු සංවර්ධන බැංකුව වෙත ඉදිරිපත් කර ඇත. උපදේශක සේවාව ලබා ගැනීම සඳහා වෙනමම ප්‍රසම්පාදන ක්‍රියාවලියක් වාරිමාර්ග අමාත්‍යාංශය සහ ආසියානු සංවර්ධන බැංකුව මඟින් සිදු කර එම සේවාව ස්ථාපිත කර ගෙවීම් උපදේශන කොන්ත්‍රාත් ගිවිසුමට අනුකූලව ගෙවනු ලැබේ. | ආසියානු සංවර්ධන බැංකුව වෙනුවෙන් වැඩ සටහන් සූදානම් කිරීමේ කාර්යයන් ගණනාවකට සම්බන්ධ වූ පුද්ගලයෙකු උපදේශන සමාගමේ සේවය කරන සමාගමකින් උපදේශන සේවා ලබාගැනීමේ කටයුතු කල නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | සිදුකිරීමට යෝජිත ඉදිකිරීම් කොන්ත්‍රාත් වල විෂයය පථය (Define the scope output and the length of the services) කොන්ත්‍රාත්වල කාර්යසාධනය පදනම් කරගෙන තීරණය කළ හැකි බැවින් ඒ මත උපදේශන ගාස්තු ගෙවීම කලයුතු වුවත්, කාලය පදනම් කරගෙන උපදේශන ගාස්තු ගෙවීම සඳහා 2015 නොවැම්බර් 16 සිට මාස 60 ක කාලයකට ඇ.ඩො.මිලියන 22.09 ක වටිනාකමකට උපදේශන කොන්ත්‍රාත්තු ගිවිසුමකට එළඹ තිබුණි. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු වල ඇති වූ ප්‍රමාදය නිසා ව්‍යාපෘති කාලය දීර්ඝ වී තිබූ නිසා මෙම දීර්ඝ වූ කාලය පදනම් කරගෙන උපදේශන ගාස්තුද ගෙවීමට සිදුවීමෙන් 2024 ජූනි 30 දක්වා අවස්ථා 06 කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර පිරිවැය ඇ.ඩොලර් මිලියන 41.56 දක්වා වැඩිකර තිබුණි. ආසියානු සංවර්ධන බැංකුව විසින් අදියර 01 සහ 02 සඳහා උපදේශන ගාස්තු ගෙවීමට වෙන්කර | මෙම උපදේශන කොන්ත්‍රාත් ගිවිසුමේ, කාර්යය මත යැපෙන එකවර ගෙවීම් (Lump sum Payment) කාලය මත පදනම් වූ ගෙවීම් (Time Base Payment) වශයෙන් උපදේශකයන්ගෙන් අවශ්‍ය සේවාවන්හි ස්වභාවය අනුව ගෙවීම් කරනු ඇත.<br>කාලය මත පදනම් වූ සේවාවන් පැහැදිලිවම කොන්ත්‍රාත් ඉදිකිරීම් අධීක්ෂණය සඳහා වන අතර "කොන්ත්‍රාත් සම්පූර්ණ කිරීමේ කාලය" අනුව වෙනස් වන බැවින් ඉදිකිරීම් කොන්ත්‍රාත්තු අවසන් වන තෙක් දීර්ඝ කිරීමට සිදු විය.<br>උපදේශන සේවාව සඳහා වෙන් කල මුල් ප්‍රතිපාදන ඩොලර් මිලියන 22.09 ක් වූයේ පළමු ණය | කාර්යසාධනය පදනම් කරගෙන උපදේශන ගාස්තු ගෙවිය යුතු වුවද කාලය පදනම් කර ගෙන උපදේශන ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් උපදේශන සේවා කොන්ත්‍රාත් ගිවිසුම නැවත සමාලෝචනය කර ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණේ ඇ.ඩො. මිලියන 25.93 ක් බැවින්, අනිකුත් වියදම් සඳහා වෙන්කළ මුදලින් වැඩි වූ උපදේශක ගාස්තු ගෙවීමට සිදු වී තිබුණි. එසේම ව්‍යාපෘතිය ආරම්භයේදී විදේශිකයින් 34 දෙනෙකු උපදේශන කටයුතු සඳහා බඳවා ගෙන තිබූ අතර, වර්තමානයේ විදේශිකයන් 08 දෙනෙකු සේවයේ යෙදෙමින් පැවතුණි. විදේශීය පුද්ගලයෙකුට මසකට යුරෝ 16,000 සිට 26,000 (රු. මිලියන 5.5 සිට රු. මිලියන 9) දක්වා පරාසයක වැටුප් ද, යුරෝ 110 සිට 70 අතර පරාසයක දෛනික යැපීම් දීමනා ද ගෙවමින් පැවතුණි. මෙම විදේශීය පුද්ගලයන් වෙත 2023 ජූනි 30 දිනට යුරෝ 12,843,998 (රු.මිලියන 4,341) ක වැටුප්ද යුරෝ 1,068,599 (රු.මිලියන 361.18) ක යැපීම් දීමනා ද ගෙවා තිබුණි. | වාරිකය සහ මාස 60 ක කාලය සඳහා පමණි. ණය වාරික 2හි කාර්යයන් සඳහා සංශෝධන සහ වෙනස්කම් කිහිපයක්, විෂය පථය වෙනස් කිරීම් සහ ක්‍රියාත්මක කිරීමේ කාලය තුළ සමහර වෙනස්කම් ඇතුළත්ව අනුමත කරන ලදී. උපදේශන සේවා සඳහා ගෙවීම් උපදේශන කොන්ත්‍රාත් ගිවිසුමට අනුකූලව ගෙවනු ලැබේ. | |
| (iii) | ව්‍යාපෘතියේ කටයුතු සඳහා විදේශීය උපදේශන සමාගම විසින් එයට අනුබද්ධ දේශීය සමාගම් 02 ක් හරහා දේශීය සේවකයන් 161 දෙනෙකු බඳවා ගෙන තිබූ අතර, දැනට එයින් 110 දෙනෙකු සේවයේ යෙදෙමින් පැවතුණි. මෙම කාර්ය මණ්ඩලයට අමතරව කොළඹ ව්‍යාපෘති කාර්යාලයේ සහ කොන්ත්‍රාත් ක්‍රියාත්මක වන ප්‍රදේශවල පිහිටා ඇති වැඩබිම් කාර්යාල 08 ක සේවය කරන 48 ක කාර්ය මණ්ඩලයක් සඳහාද කාලය පදනම් කරගෙන උපදේශන ගාස්තු ගෙවමින් පැවතුණි. එසේම ව්‍යාපෘතියට අයත් වාහන 14 ක්, යතුරු පැදි 03 ක් උපදේශන සමාගම වෙත ලබා දී තිබූ අතර 2023 ජූනි 30 දිනට ඒවායේ මෙහෙයුම් හා නඩත්තුව සඳහා රු. මිලියන 67 ක වියදම් ව්‍යාපෘතිය විසින් දරා තිබුණි.මෙමඋපදේශන සමාගම භාවිතා කරන ප්‍රධාන කාර්යාලය නවීකරණය කිරීම සඳහා රු. මිලියන 9.65 ක්ද, විවිධ ස්ථානවල පවත්වාගෙන උපදේශන සමාගමට අයත් කාර්යාල පිහිටුවීම සඳහා රු. මිලියන 13.47 ක්ද, ඒවා නඩත්තු කිරීම සඳහා රු. මිලියන 84.83 ක්ද 2023 ජූනි 30 දිනට වැය කර තිබුණි. | එකඟ නොවෙමි.<br>2023 ජූනි වන විට කොළඹ කාර්යාලය කාර්ය මණ්ඩල සාමාජිකයින් 34 ක්ද වැඩබිම් කාර්ය මණ්ඩල සාමාජිකයින් 117 ක් සඳහා කාලය මත පදනම්ව කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ගෙවීම් කර ඇත. | උපදේශන සේවා කොන්ත්‍රාත් ගිවිසුම නැවත සමාලෝචනයට ලක් කළ යුතුය. |
| (ඉ) | ආසියානු සංවර්ධන බැංකුව 2013 වර්ෂයේ නිකුත් කළ, බැංකුව සහ එහි ණයගන්නන් විසින් උපදේශකවරුන් යොදවා ගැනීමේ මග පෙන්වීම් අත්පොතෙහි 1.11(b) සහ (c) ඡේද අනුව උපදේශක කොන්ත්‍රාත්තුව සඳහා තෝරාගන්නා සමාගම හෝ සමාගම් අදාළ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වෙනත් කොන්ත්‍රාත් (උදා:- | මෙම පැවරුම් දෙක කාල පරිච්ඡේද දෙකක සිදු කර ඇත, එබැවින් අන්‍යෝන්‍ය වශයෙන් බැහැර ඒවා ලෙස සැලකේ. උපදේශකයින් තෝරා ගැනීම වාරිමාර්ග අමාත්‍යාංශය සහ ආසියානු සංවර්ධන බැංකුව මඟින් සිදු කර ඇත. | උපදේශන සේවා කොන්ත්‍රාත් ගිවිසුම හා එහි කාර්ය මණ්ඩල සංයුතිය නැවත සමාලෝචනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිර්මාණ සැලසුම් සකස් කිරීම, පාරිසරික ඇගයීම්) කලින් සිදුකර තිබේනම් උපදේශන කටයුතු සඳහා එම සමාගම් නැවත පත්කර නොගත යුතු අතර, ආසියානු සංවර්ධන බැංකුව සහ ණය ගන්නා (වාරිමාර්ග අමාත්‍යාංශය) ආයතනවල සේවකයින් සමඟ පවුල් හා ව්‍යාපාරික සබඳතා ඇති පුද්ගලයන්ද උපදේශන කටයුතු සඳහා දායක කර නොගත යුතු වේ. එසේ වුවද, මෙම වැඩසටහනේ උතුරු මැද හා වයඹ ඇළවල් ඉදිකිරීම සහ මිණිපේ ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිවල නිර්මාණ සැලසුම්, පාරිසරික ඇගයීම් වාර්තා, ශක්‍යතා අධ්‍යනය වාර්තා හා නවීකරණ වාර්තා සකස් කර ඒ සඳහා රු. මිලියන 102.98 ක මුදලක් මහවැලි උපදේශක කාර්යාංශ සමාගම හරහා ලබාගත් සමාගම පසුව මෙම වැඩසටහනේ ප්‍රධාන උපදේශක සමාගමේ ශ්‍රී ලංකා නියෝජිත සමාගම ලෙස 2015 වර්ෂයේ සිට කටයුතු කරමින් පැවතුණි. තවද එම නියෝජිත සමාගමේ ප්‍රධාන කාර්ය මණ්ඩලය ණය ගැනුම්කරු වූ වාරිමාර්ග අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන වල විශ්‍රාමලත් නිලධාරින්ගෙන් සමන්විත විය. | | |
| (ඊ) (i) | මහකිතුල උමං මාර්ගය, මහකිතුල හා මහකිරුල ජලාශ 02 හා එම ජලාශ 02 අතර ඇළ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2020 – 2024 කාලය තුළ රු.මිලියන 9,978.48 ක වටිනාකමකට ඉදිකිරීමට භාරගත් සමාගමට ඉදිකිරීම් කටයුතු සඳහා සුදුසු කාර්ය මණ්ඩලයක් සහ ඉදිකිරීම් උපකරණ නොමැති වීම, දුර්වල වැඩබිම් කළමනාකරණය යන හේතු මත සැලසුම් ප්‍රකාරව ඉදිකිරීම් ප්‍රගතිය පවත්වා ගෙන යාමට නොහැකි වී තිබුණි. ඒ හේතුවෙන් කොන්ත්‍රාත්තුව 2023 මැයි 26 අවසන් කර තිබූ අතර, ඒ වනවිට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 2.97 ක ඉදිරිකිරීම් ප්‍රගතියක් පමණක් වාර්තා කර තිබූ කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණද මහකිතුල හා මහකිරුල ජලාශ ඉදිකිරීම සහ ඒ අතර පිහිටි මහදඹේ ජලාශය වැඩි දියුණු කිරීම සඳහා අක්කර 778 ක කැලෑ ප්‍රදේශයක පිහිටි ගස් 47,552 ක් රාජ්‍ය දැව සංස්ථාව විසින් කපා ඉවත් කර තිබුණු අතර, එසේම මහකිතුල ජලාශයේ වැව් බැම්ම සකස් කිරීම සඳහා අත්තිවාරම් කපා මැටි දමා අදාළ වැව් බැම්මේ සියයට 1.5 ක වැඩ නිමකර තිබුණි. ඒ සඳහා රු. මිලියන 58.2 ක වියදමක්ද ඉදිකිරීම් අධීක්ෂණය වෙනුවෙන් උපදේශන සමාගමේ කාර්ය මණ්ඩල වැටුප්, කාර්යාල වියදම් හා වාහන නඩත්තුව සඳහා රු. මිලියන 139 ක් වැයකර තිබුණි. | එකඟවෙමි.<br>මෙම කොන්ත්‍රාත්තුව "අවසන් කිරීමක් කර තිබුණි.<br><br>රේගු අධ්‍යක්ෂ - මධ්‍යම විමර්ශන අධ්‍යක්ෂ කාර්යාලයේ 2023.10.06 දිනැති Ref: CIB/2020/00 177/CCR/014 ලිපියට අනුව, කොන්ත්‍රාත්කරු විසින් රජයට ගෙවිය යුතු නියමිත බදු සහ අනෙකුත් අයකිරීම් ගෙවා ඇත. | කාර්යසාධන ඇප බැඳුම්කර හා අත්තිකාරම් ඇප බැඳුම්කර මුදල් කර රජයට වූ පාඩුව පියවාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මෙම ඉදිකිරීම සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරු යාන් ඔය ව්‍යාපෘතියේද ඉදිකිරීම් සිදුකර තිබූ අතර, එම ව්‍යාපෘතිය සඳහා බදු සහන සහිතව ගෙන එන ලද යන්ත්‍ර සූත්‍ර උපකරණ සහ වාහන 143 ක් සඳහා ගෙවිය යුතු රේගු බදු ගෙවීම් කර මෙම ව්‍යාපෘතිය සඳහා පාවිච්චි කිරීමට 2021 අගෝස්තු 30 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. කොන්ත්‍රාත්තුව අවලංගු කිරීම නිසා මෙම යන්ත්‍ර සූත්‍ර කොන්ත්‍රාත්කරු ඉවත් කරගෙන ගොස් තිබුණි. | | |
| (ii) | කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමෙන් පසු කොන්ත්‍රාත්කරු හා උපදේශක සමාගමේ භාවිතයට අමානෝ තහඩු යොදා ඉදිකළ තාවකාලික ගොඩනැගිලි 02 ක් සහ උපදේශක සමාගම විසින් පාවිච්චි කළ ආපන ශාලාවක් ව්‍යාපෘතියට භාර දී තිබුණි. මෙම භාරගත් ගොඩනැගිලි ස්වාධීන කමිටුවක් යොදා තක්සේරු කර භාරගෙන නොතිබූ අතර, භාරගත් ගොඩනැගිලි 2023 සැප්තැම්බර් 01 දින සිට මාස 06 ක් ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂණ සමාගමක සේවය ලබා ගැනීම වෙනුවෙන් රු. මිලියන 3.57 ක් වැයකර තිබුණි. | කොන්ත්‍රාත්තුවේ විධිවිධාන ප්‍රකාරව (වැඩ අයිතමයේ BOQ විස්තරය 1.2.1), Demobilization අවස්ථාවේදී කොන්ත්‍රාත්කරු විසින් තාවකාලික පහසුකම් සමඟ සියලුම තාවකාලික ඉදිකිරීම් ප්‍රතිස්ථාපනය කල යුතුය කොන්ත්‍රාත්කරුගෙන් භාරගත් ගොඩනැගිලි (Main Camp) ආරක්ෂා කරගැනීම සඳහා ආරක්ෂණ සමාගමක සේවය ලබා ගත් අතර, ඒ සඳහා වැය වන මුදල කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට (Claim) කටයුතු කරනු ඇත. | භාරගත් වත්කම් තක්සේරු කර භාරගැනීම හා ඒවා ගිණුම්ගත කිරීමත් කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර, වැඩසටහනේ අදියර 03 සඳහා ණය ගිවිසුම් අත්සන් කිරීමට 2024 මැයි 31 දින දක්වා කටයුතු කර නොමැති අතර 2019 – 2023 කාලය තුළ නිමකල යුතු වයඹ ඇළ ව්‍යාපෘතියේ ප්‍රධාන කොන්ත්‍රාත් 03 ක් මේ දක්වා ආරම්භ කිරීමට හෝ නොහැකි වී තිබුණි. | එකඟවෙමි.<br>ADB මූල්‍යකරණය හෝ වෙනත් විකල්ප මූල්‍යකරණයක් නොමැතිකම හේතුවෙන් ඉතිරි වැඩ නැවත ප්‍රදානය කිරීම දැනට කළ නොහැක. | සැලසුම් ප්‍රකාරව කොන්ත්‍රාත් පරිපාලනය සම්බන්ධයෙන් වන අභ්‍යන්තර පාලනය අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2024 දෙවන කාර්තුවේ අදියර 03 සඳහා ලබා දීමට යෝජිත ඇ. ඩොලර් මිලියන 93 ක මුදල යොදවා උතුරු මැද පළාත් ඇළෙහි උමං විදුම් යන්ත්‍ර 02 ක් යොදවා ගෙන සිදුකරන ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව, මහවැලි කලාප වල ගොවීන් සඳහා කෘෂිකාර්මික යෙදවුම් ලබා දීම සහ මෙහෙයුම් වියදම් දැරීම පමණක් සිදු කිරීමට යෝජිතව ඇත. ඒ අනුව, මෙම වැඩසටහනේ ඉතිරි වැඩ කොටස් නිම කිරීමට කාලවකවානු තීරණය කර හෝ ඒ සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීම පිළිබඳ නිශ්චිත සැලසුමක් සකස් කර නොමැති වීම නිසා ශ්‍රී ලාංකීය ජනතාවට අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | කෙටි කාලීන ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය මූලික පියවරක් ලෙස රුපියල් මිලියන 2000ක් වෙන් කර ඇත. දිගු කාලීන උපාය මාර්ග ලෙස සංවර්ධන හවුල්කරුවන් සමඟ මූල්‍ය ප්‍රවාහය සුරක්ෂිත කිරීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව කටයුතු කරමින් පවතී. | ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිම කිරීමට කාලවකවානු තීරනය කර ඒ අනුව අරමුදල් සම්පාදනය කර ගැනීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන අදියර 02 යටතේ උතුරු මැද පළාත් ඇළෙහි කෝදුරුවාව සිට නාමල්පුර දක්වා කි.මී, 27.7 දිග උමං ඇළ ඉදිකිරීම. | | |
| (i) | මින්නේරිය - ගිරිතලේ ස්වාභාවික රක්ෂිතය, සීගිරිය අභය භූමිය, මින්නේරිය ජාතික උද්‍යානය හා හුරුළු වැව රක්ෂිතය තුළදී ඇළ ඉදිකිරීම පොළව ඇතුලතින් පමණක් Cut & Cover, double Conduit හෝ tunnel යන ක්‍රමවේද යොදාගෙන ඉදිකරන ලෙස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී තිබුණි. එසේ වුවද මෙහිදී තාක්ෂණික වශයෙන් යෝග්‍ය, ජාතික වශයෙන් ඵලදායී, පාරිසරික වශයෙන් අවම බලපෑම් වන ක්‍රමවේදය ලෙස පිරිවැය අධික ක්‍රමයක් වූ උමං විදුම් යන්ත්‍ර 02 ක් යොදාගෙන කැණීම් කිරීමේ ක්‍රමවේදය තෝරා ගෙන තිබුණි. | එකඟ නොවෙමි. | තාක්ෂණික වශයෙන් යෝග්‍ය, ජාතික වශයෙන් ඵලදායී, පාරිසරික වශයෙන් අවම බලපෑම් වන හා පිරිවැය අවම වන පරිදි කැණීම් කිරීමේ ක්‍රමවේදයක් තෝරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | කැණීම් සඳහා අවශ්‍ය 1 වන උමං විදුම් යන්ත්‍රය චීනයේ සිට ආනයනය කර වැඩබිම වෙත ප්‍රවාහනය කර එය සවිකිරීම වෙනුවෙන් රු. මිලියන 6,690.97 ක එකඟ වූ සම්පූර්ණ මුදලම කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණද උමං විදුම් යන්ත්‍රය ත්‍රිකුණාමලය වරායෙන් පිටතට එන අවස්ථාව වන විට එහි පිරිවැය රු. මිලියන 2,155.97 ක් වී තිබුණි. ඒ අනුව ත්‍රිකුණාමලය සිට නාමල්පුර දක්වා යන්ත්‍රය ප්‍රවාහනය කර එකලස් කිරීම සහ කොන්ත්‍රාත්කරුගේ ලාභය වෙනුවෙන් රු.මිලියන 4,535ක මුදලක් ගෙවා තිබුණි. | මෙම කොන්ත්‍රාත්තුව සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමේදී තරඟකාරී ලංසු ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කර ඇත. | ලංසු ඇගයීමේදී කාර්යක්ෂම හා පිරිවැය අවම වන කොන්ත්‍රාත් ක්‍රමවේදය තෝරාගැනීමට කටයුතු කළ යුතු අතර කොන්ත්‍රාත් පරිපාලනය සම්බන්ධයෙන් වන අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |
| (iii) | කොන්ත්‍රාත්තුව පිරිනැමීමට වසර **2½** ක් ප්‍රමාද වීම නිසා කොන්ත්‍රාත්තුව නිම කිරීමේ කාලය 2027 මාර්තු 10 දක්වා දීර්ඝ වී තිබුණු අතර 2025 ජූනි මාසයේ කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට Drill & Blasting ක්‍රමය යටතේ ඉදි කිරීමට නියමිතව තිබූ කි.මී. 10.4 ක් වූ දුර ඉදිකිරීම සඳහා දෙවන උමං විදුම් යන්ත්‍රයක් යොදවා ගෙන තිබුණි. | එකඟ නොවේ.<br><br>මෙය කොන්ත්‍රාත්තුවේ කල් දිගුවක් යටතේ සිදු නොකරන ලදී. එක් TBM යන්ත්‍රයක් සමඟ මුල් ගිවිසුමේ කොන්ත්‍රාත් කාලය දින 2,191කි. (වැඩ අවසන් කිරීමේ දිනය 2027 මාර්තු 10 ) | කොන්ත්‍රාත් පරිපාලන සම්බන්ධයෙන් වන අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |
| (iv) | උපදේශන සමාගම විසින් උමං විදුම් යන්ත්‍රයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, වැඩබිම වෙත ප්‍රවාහනය කර සවි කිරීම සඳහා පිරිවැය ලෙස රු. මිලියන 7,255.40 ක් ඇස්තමේන්තු කර තිබූ අතර කොන්ත්‍රාත්කරු විසින් ඒ සඳහා රු.මිලියන 6,690.97 ක මිලක් ඉදිරිපත් කර තිබුණි. මෙම යන්ත්‍ර 2 ආනයනය කිරීමේදී ව්‍යාපෘතිය වෙත ඉදිරිපත් කර තිබූ ඉන්වොයිස් පත්‍ර | TBM යන්ත්‍රය සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන්වල වටිනාකම රුපියල් මිලියන 6,690.97ක් ලෙස නිවැරදි විය යුතුය. ඇස්තමේන්තුගත අගය සහ CIF අගය එකිනෙක සැසඳිය | ඇස්තමේන්තු පිළියෙල කිරීම හා උපදේශකයින් තෝරා ගැනීම සම්බන්ධයෙන් වන අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | **2** අනුව එම යන්ත්‍ර 02 හි CIF වටිනාකම් පිළිවෙළින් ඇ.ඩො. 10,581,673 (රු.මිලියන 2,147.97) ක් සහ ඇ.ඩො.9,476,342 (රු. මිලියන 3,523.61) ක් එනම් එකතු වටිනාකම රු. මිලියන 5,671.58 ක් විය. ඒ අනුව උපදේශක සමාගම විසින් ප්‍රමාණ පත්‍ර සකස් කිරීමේදී මෙවැනි යන්ත්‍රයක වටිනාකම පිළිබඳ තහවුරුවක් ලබා නොගෙන මෙම අයිතමය සඳහා අධි ඇස්තමේන්තු සකස් කර තිබුණි. | නොහැක. | |
| (v) | 2 වන උමං විදුම් යන්ත්‍රයක් යෙදවීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කළ තාක්ෂණ ඇගයීම් කමිටුවම නිර්දේශ කර නොතිබුණු අතර අමාත්‍යාංශ ලේකම් විසින් විශේෂ තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත්කර තිබුණි. එම කමිටුව විසින් යෝජනාවේ ශක්‍යතාවය සැක සහිත වන බවත් කොන්ත්‍රාත්තුව සඳහා අමතර අරමුදල් ආයෝජනය කිරීම සාධාරණීකරණය කළ නොහැකි බවට නිර්දේශ ඉදිරිපත් කර තිබිය දී එම කමිටුවේ තීරණය පිළිගැනීමට කටයුතු කර නොතිබූ අතර නැවත පත්කළ විශේෂ තාක්ෂණික ඇගයීම් කමිටුවක් මඟින් **2** වන උමං විදුම් යන්ත්‍රයක් යෙදවීමට නිර්දේශය ලබා ගෙන තිබුණි. එහිදී කමිටු **2**ක් මිලදිගැනිම ප්‍රතික්ෂේප කළ බව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | අමතර අරමුදල් ආයෝජනය කිරීම සාධාරණීකරණය කළ නොහැකි බවට වූ කමිටුවේ තීරණය පිළිගැනීමට කටයුතු නොකර අමාත්‍ය මණ්ඩලය වෙත ව්‍යාජ තොරතුරු සැපයූ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (vi) | 02 වන උමං විදුම් යන්ත්‍රයද චීනයේ සිට ආනයනය කර වැඩබිම වෙත ප්‍රවාහනය කර එය සවිකිරීම වෙනුවෙන් රු. මිලියන 6,690.97 ක සම්පූර්ණ මුදල කොන්ත්‍රාත්කරුට ගෙවීමට එකඟව 2024 මාර්තු 15 වනවිට එයින්**,** රු. මිලියන 6,021.87 ක් ගෙවා තිබුණි. උමං විදුම් යන්ත්‍රය ත්‍රිකුණාමල වරායෙන් පිටතට එන අවස්ථාව වන විට එහි පිරිවැය රු.මිලියන 3,635.61 ක් වී තිබුණි. ඒ අනුව**,** ත්‍රිකුණාමලය සිට කෝඳුරුවාව දක්වා යන්ත්‍ර ප්‍රවාහනය කර එකලස් කිරීම වෙනුවෙන් රු. මිලියන 3,055.36 ක් ගෙවා තිබීම විගණනයේදී මතභේදයට තුඩු දී තිබුණි.<br>2022 නොවැම්බර් 22 ආනයනය කරන ලද 2 වන උමං විදුම් යන්ත්‍රය 2023 මාර්තු සිට 2024 මාර්තු දක්වා තාවකාලිකව ක්‍රියාත්මක නොකිරීමට අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන තිබුණි. යන්ත්‍රය සවිකිරීමෙන් පසු 2023 මාර්තු සිට මාස 8 ක කාලයක් නිෂ්කාර්යව තිබී 2023 නොවැම්බර් 23 සිට ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබුණු අතර**,** එදින සිට 2024 පෙබරවාරි 29 දින දක්වා මාස 3 | TBM යන්ත්‍රය සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන්වල වටිනාකම රුපියල් මිලියන 6,690.97ක් ලෙස නිවැරදි විය යුතුය. ඇස්තමේන්තුගත අගය සහ CIF අගය එකිනෙක සැසඳිය නොහැක. | ඉදිකිරීමේ ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව කටයුතු තළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක කාලයකට ප්‍රගතිය මීටර් 399.91 ක අවම මට්ටමක තිබුණි. | | |
| (vii) | කොන්ත්‍රාත්තුව අවසානයේ විදුම් යන්ත්‍ර 2 ගලවා වරාය දක්වා ප්‍රවාහනය කිරීම වෙනුවෙන් රු. මිලියන 179.99 ක් ප්‍රමාණ පත්‍රයට ඇතුල් කර තිබුණි. ඒ අනුව රු. මිලියන 13,381.94 ක් වටිනා යන්ත්‍ර 2 වෙනුවෙන් වැයකළ පිරිවැයෙන් කොටසක් හෝ මුදලක් තක්සේරු කර නැවත ලබා ගැනිමට ගිවිසුම් මගින් එකඟ වී නොතිබූ අතර යන්ත්‍ර 2 කිසිදු අයකිරීමක් රහිතව මෙරටින් රැගෙන යාමට එකඟ වී තිබුණි. | මෙම සියලු ක්‍රියාවන් ලංසු ලියකියවිලි වල සේවා යෝජකයාගේ අවශ්‍යතාවය යටතේ දක්වා ඇති අතර, ඒ අනුව ලංසුකරුවන් ඔවුන්ගේ ලංසු ඉදිරිපත් කර ඇත. | ඉදිකිරීමේ ඇස්තමේන්තු පිළියෙල කිරීම හා කොන්ත්‍රාත් පරිපාලනය සම්බන්ධයෙන් වන අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |
| (viii) | උමං මාර්ගයේ දුර්වල පාෂාණ තිබෙන ස්ථාන වලට කොන්ක්‍රීට් වළලු (Ring) යෙදීම සඳහා එම වළලු සකස් කිරීමේ කම්හලක් හා ගබඩාවක් ඉදිකිරීමට පිළිවෙළින් රු. මිලියන 928.72 ක් රු. මිලියන 149.82 ක්ද සහ එම වළලු සකස් කිරීමට රු. මිලියන 2,892.3 ක් ද වන පරිදි ගිවිසුම්ගත වී තිබුණි. මෙම කම්හලේ නිෂ්පාදනය කර 2024 ජනවාරි 31 දිනට උමං මාර්ගයේ සවිකරන ලද කොන්ක්‍රීට් වළලු 2,967 න් වළලු 1,298 ක් එනම් සියයට 44 ක් විවිධ ස්ථාන වලින් පුපුරා තිබුණු බවට හඳුනාගෙන තිබුණි. | මෙහි දක්වා ඇති අගයන් අදාළ BOQ අයිතම සමඟ හෝ හඳුනාගත් ඉරිතැලීම් පිළිබඳ වාර්තා සමඟ හරියටම නොගැලපෙන නමුත්, එම සිදුවීම සත්‍ය වශයෙන්ම සිදු වූ ලෙස පිළිගනු ලැබේ. ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුව ඉංජිනේරු සහ කොන්ත්‍රාත්කරුගේ විශේෂඥයින් මේ සඳහා හේතු සහ නිවැරදි කිරීමේ ක්‍රම හඳුනාගැනීමේ නිරත වී ඇත. සේවායෝජකයා ද සිදුවෙමින් පවතින ප්‍රතිකාර ක්‍රියාවලීන් කෙරෙහි ඉහළ අවධානයක් යොමු කර ඇත. | හානි වූ කොන්ක්‍රීට් වළලු නැවත සකසා ගත යුතුය. |
| (ix) | උතුරු මැද පළාත් ඇළ ඉදිකිරීම මගින් මහකනදරාව ජලාශයට ලබා ගන්නා ජලයෙන් රඹෑව, මැදවච්චිය ප්‍රදේශයට පානීය ජලය සැපයීම සඳහා රු. මිලියන 11,515 ක් ඇස්තමේන්තු ප්‍රතිපාදන යටතේ ජපන් අන්තර්ජාතික සහයෝගීතා නියෝජ්‍යායතන ආධාර මත අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය ආරම්භ කර එහි වැඩ කටයුතු නිම වීමට ආසන්න මට්ටමක පැවතුණද, උතුරු මැද පළාත් ඇල ව්‍යාපෘතිය නියමිත කාලය තුල ක්‍රියාත්මක නොවීම නිසා මෙම ව්‍යාපෘතියේ ජලය මහකනදරාව ජලාශයට ලැබෙන තෙක් මෙම පානීය ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කල නොහැකි මට්ටමක පැවතුණි.එසේම උතුරු මැද පළාත් ඇළ ඉදිකිරීමට පවරාගත් ඉඩම් සඳහා වන්දි ගෙවා තිබූ අතර තවදුරටත්, ඉඩම් කට්ටි 259 ක් එනම් මුළු ප්‍රමාණයෙන් සියයට 40 ක් පවරා ගත යුතුව පැවතුණි. තවද, වන්දි ගෙවන ලද ඉඩම් කට්ටි 385 | එකඟ වෙමි. ඉදිරියේදී ඉඩම් පවරා ගැනීමේ කටයුතු අවසන් කරනු ඇත | ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ හැකිවන පරිදි ඇල ව්‍යාපෘතිය ඉදිකිරීම් කඩිනම් කිරීමට ඉඩම් පවරා ගැනීම හා වන්දි ගෙවීම කඩිනම් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක ඉඩමේ භුක්තිය ඉඩම් හිමියන්ගෙන් භාර ගෙන වාරිමාර්ග අමාත්‍යාංශය වෙත පවරා ගැනීම මේ දක්වා සිදු කර නොතිබුණි. | | |
| (x) | මොරගහකන්ද ජලාශයේ සිට කන්දරා ඔය දක්වා කි.මී. 96 ක් දුරට ගමන් කරන උතුරු මැද පළාත් ඇළෙහි කි.මී. 27.7 ක් දිග උමං ඇල මාර්ගය පමණක් 2025 වර්ෂයේ වැඩසටහන අවසන් වනවිට නිම කිරීමට මේ වන විට සැලසුම් කර ඇත. මේ නිසා කි.මී. 68.3 වූ ඉතිරි ඇල මාර්ගය ඉදිකර එහි ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා නිශ්චිත සැලැස්මක් විගණිත දිනය වන තුරු ඉදිරිපත්ව නොතිබුණි. කි.මී. 27.7 ක් දිග උමං ඇල මාර්ගය කැණීම් කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය 2023 දෙසැම්බර් 31 දිනට සියයට 21 ක් විය. | ඉතිරි කොන්ත්‍රාත් පැකේජ ප්‍රසම්පාදනය සඳහා සියලුම ලියකියවිලි නිම කර ඇති අතර කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අරමුදල් ලැබුණු පසු ඕනෑම අවස්ථාවක ටෙන්ඩර් ප්‍රදානය කළ හැකිය. මූල්‍ය ප්‍රභවයන් ලබා ගැනීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විවිධ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් සපයන ආයතන සමඟ සාකච්ඡා කරමින් පවතී. | මාර්ගය ප්‍රතිලාභ මහජනතාවට ලබාගැනීමට හැකි වන පරිදි සැලැස්මක් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ඒ) | 2018 වර්ෂයේදී රු. මිලියන 7,146.91 ක වටිනාකමට පිරිනමා තිබූ කළුගඟ මොරගහකන්ද යා කරන උමං ඇළ මාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2021 සැප්තැම්බර් 10 දින නිමකල යුතු වුවත් නියමිත කාලය තුල නිම කිරීමට නොහැකි වීම නිසා 2023 දෙසැම්බර් 21 දක්වා දීර්ඝ කර තිබුණි. නමුත්, එදිනට ද ඉදිකිරීම් ප්‍රගතිය සියයට 90 ක් විය. | 2024 අගෝස්තු 31 දක්වා තවත් දීර්ඝ කිරීමක් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කර ඇති අතර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට නියමිතව ඇත. | ව්‍යාපෘතිය අවසන් කර ප්‍රතිලාභ ලැබීමට සැලැස්විය යුතුය. |
| (ඔ) | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන විසින් 2022 වර්ෂයේ මිලදී ගත් පොහොර තොගයක් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින පොහොර සමාගම් 02 කට භාරදී තිබූ අතර එහිදී රු.මිලියන 55.23 ක් වටිනා පොහොර මෙ.ටොන් 161.5(බෑග්3,230) ක ඌණතාවයක් ඇති වී තිබුණි. මේ පිළිබඳව පරීක්ෂණ පැවැත්වීමට වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් පත්කළ පරීක්ෂණ කමිටුවක් මඟින් වරාය අධිකාරියේ වාර්තා නැවත නිවැරදි කර එම නිවැරදි වාර්තා පදනම් කරගෙන සැපයුම්කාර සමාගමෙන් ඌණතාවය අයකර ගැනීමට නිර්දේශ කර තිබුණත්,එම අලාභය සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | මෙම ගැටළුව විමර්ශනය කිරීමට කටයුතු ආරම්භ කර ඇත | පොහොර තොග ඌනතාවය අයකරගැනීම කළ යුතුය. |
| (ඕ) | දේශීය කෘෂිකාර්මික භෝග වැඩි දියුණු කිරීමේ වැඩසටහන යටතේ මහවැලි කලාප 5 ක හා හුරුළු වැව ප්‍රදේශවල ගොවීන්ට දෙමුහුම් මිරිස් බීජ දේශීයව නිෂ්පාදනය කිරීම සඳහා Poly Tunnel ඒකක 50 ක් සපයා සවිකිරීමේ ව්‍යාපෘතියක් රු.මිලියන 91.57 ක කොන්ත්‍රාත් වටිනාකමකට ක්‍රියාත්මක කර තිබුණි. මේ සඳහා | වැඩ අවසන් කිරීම සඳහා ලබා දුන් කාලය 2024 මැයි 31 ඉක්මවූහොත්, කොන්ත්‍රාත් ගිවිසුම අනුව කටයුතු කරනු ඇත. | මිල ගණන් ඇගයීම හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් අනලස්ව ක්‍රියාකර ඇත්ද යන්න පරීක්ෂාකර එම |

| | | | |
|---|---|---|---|
| | තෝරාගත් කොන්ත්‍රාත්කරු Poly Tunnel සකස් කිරීම සම්බන්ධ පෙර පළපුරුද්දක් ලබා නොතිබුණු අතර, 2018-2020 කාලය තුල අලාභ ලබා 2021 කාලය තුල පමණක් ලාභයක් ලැබූ සමාගමක් විය. 2023 මැයි 15 දිනට වැඩ නිම කිරීමට එකඟ වී තිබුණද 2024 අප්‍රේල් 30 දින වන විටත් Poly Tunnel 42 ක් පමණක් සවිකර තිබුණ අතර 2024 මැයි 31 දක්වා අවස්ථා තුනකදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. | | නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාරිමාර්ග අමාත්‍යාංශය නමින් වාහන 654 ක් ලියාපදිංචි වී වාහන ලේඛනය අනුව හා පරිහරණය කරණු ලබන වාහන සංඛ්‍යාව 74 ක් විය. ඒ අනුව වාහන 580 ක් විගණිත දින වන විට අමාත්‍යාංශය භාරයේ නොපැවතුණි. | පිළිතුරු සපයා නැත. | අමාත්‍යාංශය භාරයේ නොපවතින වාහන සම්බන්ධයෙන් සොයාබැලීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වී ඇති වාහන 580 අතරින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වාහන 43 ක්ද, මහවැලි අධිකාරිය වාහන 253ක්ද, බලශක්ති අමාත්‍යාංශය වාහන 04ක්ද, වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත වාහන 28 ක්ද නිදහස් කර දිගු කාලසීමාවක් ගතවී ඇතත් අයිතිය එම ආයතන වෙත පැවරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. අදාළ වාහන එම ආයතන භාරයේ පවතින බවට වාර්ෂිකව සනාථ කර ගැනීමක්ද කර නොතිබුණි. | අමාත්‍යාංශය යටතේ පවතින සියලු ආයතන හා ව්‍යාපෘති සඳහා ගෙන්වනු ලබන වාහන අමාත්‍යාංශයේ ලේකම් නමින් ලියාපදිංචි කර ඒවා අදාල දෙපාර්තුමේන්තු,ආයතනය වෙත හෝ ව්‍යාපෘති වෙත ලබා දුන් පසු තවදුරටත් එම වාහන නියාමනයක් කිරීම වාහන භාර ගන්නා ලද ආයතන විසින් සිදු කල යුතුය.වාරිමාර්ග දෙපාර්තුමේන්තුව, මහවැලි අධිකාරිය යන ආයතන සතුව වෙන් වෙන් ව ප්‍රවාහන අංශයන් පවතින අතර එම අංශ මඟින් අදාල වාහන වල නියාමනයක් සිදු කරයි. ව්‍යාපෘති වල ද ප්‍රවාහන විෂය භාර නිළධාරීන් විසින් එක් එක් ව්‍යාපෘතිවලට අදාල වාහන පිලිබඳ කාර්යයක් ඉටු කරයි. එම වාහන පිලිබඳ තොරතුරු අදාල ආයතන හෝ ව්‍යාපෘති වෙතින් ලබා ගැනීමට හැකියාව ඇත.මෙම වාහන පිළිබඳ ව ලොග් සටහන් පවත්වා ගැනීම එක් එක් ආයතනය මඟින් කල යුතු බවට ඔවුන් වෙත උපදෙස් ලබා දීමට කටයුතු කෙරේ | වාහන පරිපාලනය සම්බන්ධයෙන් වන අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මහවැලි අධිකාරිය වෙත ලබා දී තිබූ වාහන 253 න් වාහන 16 ක් මහවැලි අධිකාරිය භාරයේ නොපැවතුනු අතර අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ ලේඛන ගතකිරීමකින් තොරව වාහන විවිධ අංශය විසින් භාවිතා කරමින් පැවතුණි. ඒ අනුව ඩබල් කැබ් රථ 11 ක් DSDP/තණමල්විල ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ලබා දී තිබුණද මහවැලි අධිකාරියේ සංවිධාන ව්‍යුහය තුල එවැනි කලාප කාර්යාලයක් තණමල්විල පිහිටා නොතිබුණි. | අදාල කරුණු පිළිබඳ මහවැලි අධිකාරියෙන් සහ වාරිමාර්ග දෙපාර්තමේනතුවෙන් විමසා ඇති අතර පිළිතුරු ලද පසු ඔබ වෙත ඉදිරිපත් කරමි. | අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වී ඇති වාහන ලබාදී ඇති ආයතන වෙත පවරා දිය යුතුය. |
| (ඈ) | අමාත්‍යාංශ ලේකම් නමින් පැවති අංක 56–8184 දරන කැබ් රථය අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව මහවැලි අධිකාරිය විසින් 2023 වර්ෂයේදී වෙන්දේසි කර තිබූ අතර එහි ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කරද නොතිබුණි. | අදාල කරුණු පිළිබඳ මහවැලි අධිකාරියෙන් සහ වාරිමාර්ග දෙපාර්තමේනතුවෙන් විමසා ඇති අතර පිළිතුරු ලද පසු ඔබ වෙත ඉදිරිපත් කරමි. | වාහනය වෙන්දේසි කිරීම සොයාබැලිය යුතු අතර එහි ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සනාථ කර ගත යුතුය. |

### 3.4 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් පොත් වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශනයේ තව දුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති වාහන අනතුරු 2 කට අදාළව එකතුව රු.10,561,210 ක් ශේෂයක් වූ අතර, ඉන් අංක WPPG 0456 දරන වාහනයේ සිදුවූ අනතුරට අදාළව සිදුව තිබූ අලාභය රු. 10,482,500 ක් 2023 දෙසැම්බර් 31 දිනට රක්ෂණ ආයතනයෙන් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. අනතුර සිදු වන අවස්ථාවේදී රියදුරු මත්පැන් පානය කර වාහනය ධාවනය කර තිබූ බැවින් රක්ෂණ ආයතනය හිමිකම ගෙවීම ප්‍රතික්ෂේප කර තිබූ අතර මූ.රෙ.104 පරීක්‍ෂණයෙන් වගකිවයුතු පාර්ශවය වූ රියදුරු වෙතින් අලාභය අයකර ගැනීම නිර්දේශ කර තිබුණි. ඒසේ වුවද එම අලාභය අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | මු.රෙ.104 (4) ට අනුව පරීක්ෂණයෙහි පරිදි වරදකරු වී ඇති එම්.ඩබ්.විජිත බණ්ඩාර විජේතුංග මයාගෙන් රු.10,482,500 ක අලාභ මුදල අයකරගැනීමට අදාලව මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් 2022.11.22 හා 2023.02.06 දිනැති ලිපියට ප්‍රතිචාරයක් දක්වා නොතිබුණි.ඉන්පසුව අමාත්‍යාංශය මගින්ද 2023.10.10 වන දින ලිපියක් යොමුකර, එම ලිපිය ලැබී දවස් 7ක් ඇතුලත පිළිතුරු දන්වා සිටින ලෙසත් එසේ නොවුවහොත් නීතිමය ක්‍රියාමාර්ග ගැනිම සඳහා නිතිපති වෙත දැනුම් දීමට පියවර ගැනිමට සිදු වන බව දන්වන ලදී. අදාල අලාභ මුදල අයකර ගැනීම සඳහා අවශ්‍ය අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට නිතීපති දෙපාර්තමේන්තුවේ නිතීඥ සහය සහ උපදෙස් ඉල්ලා 2023.10.09 දිනැති ලිපිය මගින් අදාල ලේඛණ ඇතුලත්ව අමාත්‍යාංශයේ නීති නිලධාරී විසින් ලේකම්තුමා හරහා ගරු නිතීපති වෙත යොමු කිරිමට කටයුතු සිදු කර ඇත. | මු.රෙ.පරීක්‍ෂණයේ නිර්දේශය පරිදි එම අලාභය කඩිනමින් අයකර ගත යුතුය. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කරන ගෙවීම් පටිපාටිය, මුදල් රෙගුලාසි 135 ප්‍රකාර මූල්‍ය පාලනය සම්බන්ධව කාර්යයන් පැවරීමට අනුකූල නොවන බැවින් එම පටිපාටිය නිවැරදි කරන ලෙස 2011 මාර්තු 22 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී අමාත්‍යාංශ ලේකම්ට නියෝග කර වසර 13ක් ගත වී තිබුණද 2024 මැයි 31 වන විටත් නියෝගය ක්‍රියාත්මක කර නොතිබුණි. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කරන ගෙවීම් පටිපාටිය, මුදල් රෙගුලාසි 135 ප්‍රකාර මූල්‍ය පාලනය සම්බන්ධව කාර්යයන් පැවරීමට අනුකූල නොවන බැවින් එම පටිපාටිය නිවැරදි කරන ලෙස ලබාදුන් ගිණුම් කාරක සභාවේ නියෝගයට, ගිණුම් කාරක සභා සභාපති වෙත MI/F-**13/**AQ/IRRI DEPART/GEN හා 2023.12.01 දිනැති ආවරණ ලිපිය මගින් පිළිතුරු ඉදිරිපත් කර ඇත. | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දී ඇති නියෝග ක්‍රියාත්මක කර ඒ පිළිබඳ තක්සේරුවක් සමඟ රාජ්‍ය ගිණුම්කාරක සභාව වෙත වාර්තා කළ යුතුය |
| (ආ) | මොරගකන්ද ජල විදුලි බලාගාර ව්‍යාපෘතියේ අදියර I, II හා III මගින් උත්පාදිත විදුලිය වෙනුවෙන් 2021 – 2023 කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් රු.3,697,431,708 ක ඉන්වොයිස්පත් ඉදිරිපත් කර තිබූ නමුත් ඉන් සියයට 23 ක් හෙවත් රු. 853,731,252 ක් පමණක් ලංකා විදුලි බල මණ්ඩලය විසින් ගෙවා තිබුණි. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉහත සඳහන් පරිදි ගෙවිය යුතු හිඟ ආදායම් එකතුව රු. 2,843,700,456 ක් වූ අතර ඉදිරිපත් කර තිබූ ඉන්වොයිස්පත් සඳහා ගෙවිම් කල යුතු දිනය නියම කර, ප්‍රමාණවත් ගෙවීම් කාලයක් ලබාදී අනතුරුව පොළි අයකල හැකිවන පරිදි ගිවිසුම්ගතව නොතිබීම නිසා ලංකා විදුලිබල මණ්ඩලයෙන් අදාළ මුදල් සහ පොළිය අයකර ගැනීමට නොහැකි වී තිබුණි | මෙම වර්ෂය තුල උක්ත බිල්පත් නිරවුල් වූවද යන්න පිළිබඳව දැනුම් දීමේදි විදුලි බල මණ්ඩලය විසින් මෙම වර්ෂය තුල අප වෙත ලැබිය යුතු බිල් වටිනාකම් වෙනුවෙන් මාරු කරන ලද මුදල් ප්‍රමාණය ඉන්වොයිස් වශයෙන් ලබා නොදීම මත වටිනාකම ලබා දීම ගැටළුකාරී වී ඇත.<br>ලංකා විදුලිබල මණ්ඩලයෙන් අයවිය යුතු හිඟ ආදායම් සම්බන්ධයෙන් හා ගෙවීම් කල යුතු දිනය නියමකර ප්‍රමාණවත් කාලයක් ලබා දී අනතුරුව පොළී අයකල හැකිවන පරිදි ගිවිසුම් ගතවීම සඳහා ක්‍රමවේදයක් සකස්කර ඉදිරියේදි එය ක්‍රියාත්මක කර ගැනීම සඳහා අදාල පාර්ශවයන් වෙත දැනුම් දීමට කටයුතු කරන බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි. | ලංකා විදුලිබල මණ්ඩලයෙන් අයවිය යුතු හිඟ ආදායම් සම්බන්ධයෙන් හා ගෙවීම් කල යුතු දිනය නියමකර ප්‍රමාණවත් කාලයක් ලබා දී අනතුරුව පොළී අයකල හැකිවන පරිදි ගිවිසුම් ගතවීමට කටයුතු කල යුතුයි. |
| (ඇ) | ජපාන රජයේ ආධාර යටතේ 2003–2013 කාලසීමාව තුල ක්‍රියාත්මක කර තිබූ නිවත්කම් දනන් බලගැන්වීමේ (PEACE) ව්‍යාපෘතියේ 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව නිකුත් කර වසර 10 ක් ගතවී ඇතත් ඒ මගින් පෙන්වා දි ඇති වත්කම් පරිපාලනයේ පැවති දුර්වලතා පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි. එම නිරීක්ෂණ සම්බන්ධව JICA | නිවත්කම් දනන් වත්කම් හා බලගැන්වීමේ (PEACE) ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා නිරවුල්කිරීමේ සහතිකය ලබා ගැනීමට අදාළව විගණන වාර්තාවෙන් විමසන ලද කරුණු සඳහා තොරතුරු ලබා දීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරන ලද පස් | වත්කම් පරිපාලනයේ දුර්වලතා පිළිබඳ විගණකාධිපති පෙන්වා දි ඇති කරුණු පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමුකර නිරවුල් කිරීමේ සහතිකපත් සකස් නොකල නිලධාරින් සම්බන්ධව |

| | | | |
|---|---|---|---|
| | ආයතනය විසින් නිරවුල් කිරීමේ සහතිකපත් ඉල්ලා වසරක් ගතවී ඇතත් ව්‍යාපෘතිය යටතේ මිලදී ගත් ජල බවුසර්, කැබ් රථ හා ශීතකරණ කැබ් රථයේ පැවැත්ම හා භාවිතය පිළිබඳ විශ්වාසනීය තොරතුරු අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර නොතිබිම හේතුවෙන් අදාල නිරවුල් කිරීමේ සහතික නිකුත්කිරීමට නොහැකිවී තිබුණි. ඒ හේතුවෙන් ජපාන රජයේ ණය ආධාර මුදල් එකවර පියවීමට ශ්‍රී ලංකා රජයට සිදුවන තත්වයක් නිර්මාණය වී තිබුණි. | දෙනෙකුගෙන් සමන්විත කමිටුව මගින් ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් ජල බවුසර් , ෆ්‍රාසෝ කැබ් රථය හා ශීතකරණ කැබ් රථය යන ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් සිදු කළ විමර්ශනය අනුව, කරුණු සනාථ කිරීමට අදාළව ලියකියවිලි ඇතුළත් අවසන් වාර්තාව ඉදිරිපත් කර ඇත. | ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | අමාත්‍යාංශය යටතේ වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සම්පත් යොදා ආරම්භ කරන ලද මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම ව්‍යාපෘති කමිටුව විසින් තෝරාගත් බාහිර ආයෝජකයකු සමඟ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස ප්‍රතිසංවිධානය කිරීම සඳහා 2018 සැප්තැම්බර් 18 දිනැති අංක අමප/18/2083/803/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව සමාගම රාජ්‍ය පෞද්ගලික කොටස් හිමි ඒකාබද්ධ ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අභිලාෂයන් කැඳවීමට 2022 පෙබරවාරි 28 දින 2022/338/5117 අංක දරන තීරණය මඟින් අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. අදාල ප්‍රතිසංවිධානය කිරීම සඳහා ඉදිරියට සිදුකිරීමට අපේක්ෂිත කාර්යයන්හි කාලරාමුව අනුව 2024 අප්‍රේල් 22 දින වනවිට සුදුසු ව්‍යාපෘති තෝරා ගතයුතු වුවත්, එම කටයුතු නිමකර නොතිබුණි. | ප්‍රතිසංවිධානය කිරීමේ වැඩසටහනෙහි සිදු කිරීමට අපේක්ෂිත කාර්යයන්හි කාල රාමුව අනුව ආයෝජකයින් වෙතින් ව්‍යාපෘති වාර්තා කැඳවීම දක්වා වූ ක්‍රියාවලිය කාල රාමුවේ සඳහන් කාල සීමාව ඇතුලත සිදු කර ඇත. නමුත් ලැබී තිබූ ව්‍යාපෘති වාර්තා, ව්‍යාපෘති කමිටුව වෙත ඉදිරිපත් කොට ඇතත් ඒවා අතුරින් සුදුසු ව්‍යාපෘති වාර්තා තෝරා ගැනීමේ ක්‍රියාවලිය ව්‍යාපෘති කමිටුව විසින් 2024.07.30 දින වන විටත් අවසන් කර නොමැත. | ප්‍රතිසංවිධාන අනුමැතීන්ට අනුව, අපේක්ෂිත කාර්යයන්හි කාලරාමුව අනුව ආයෝජකයින්ගේ සුදුසු ව්‍යාපෘති තෝරා ගැනිමට කටයුතු කල යුතුයි. |
| (ඉ) | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් අනුබද්ධිත සමාගම් දෙකක් වන මහවැලි වෙන්චර් කැපිටල් (පුද්) සමාගම 2012 වර්ෂයේදීද, ස්වභාවික සම්පත් කළමනාකරණ (පුද්) සමාගම 2019 වර්ෂයේදී ද ඈවර කිරීමට තීරණය කර තිබුණද, විගණිත දින වූ 2024 මැයි 31 වන විටද ඈවර කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | මහවැලි වෙන්චර් කැපිටල් (පුද්) සමාගමඈවර කිරීමේ කටයුතු අවසන් කොට ඈවරකරුවන් විසින් 29B ආකෘතිය සමාගමේ රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත 2024.06.24 දින භාර දී ඇත. මෙම සමාගමේ ගිණුම්වල පැවති සියළු ශේෂ මහවැලි අධිකාරියේ ගිණුමට මේ වන විට බැර කොට ඇත. | ඈවර කිරීමේ කටයුතු අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරික්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාරිමාර්ග අමාත්‍යාංශයට 2018 වර්ෂයේදි අනුයුක්ත කර තිබූ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III පන්තියේ නිලධාරියෙකු වෙත අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන), අධ්‍යක්ෂ (තාක්ෂණික විගණන) වශයෙන් අමාත්‍යාංශයේ තනතුරු දෙකක්ද, ඒ යටතේ පවතින සමාගමක ප්‍රධාන විධායක නිලධාරි හා අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙකු ලෙස සහ අමාත්‍යාංශය යටතේ වූ ව්‍යාපෘතියක ව්‍යාපෘති අධ්‍යක්ෂ වශයෙන් තනතුරු 4 ක වගකීම් පවරා තිබුණි. | | |
| (i) | වාරිමාර්ග අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (තාක්ෂණික විගණන) තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා උක්ත නිලධාරීයා 2018 සැත්තැම්බර් 15 දින සිට පත්කර තිබුණද ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය විගණනය වෙත ඉදිරිපත් නොවීය. | 2020 සැප්තැම්බර් 15 දින සිට 2023 අප්‍රේල් 20 දින දක්වා රාජකාරී ඉටුකිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් විධිමත් පරිදි අනුමැතිය ලබා ගැනීම එවකට පැවති කොරෝනා තත්වය මත රාජකාරී සඳහා නිලධාරීන්ගේ පැමිණීම සීමා වූ බැවින් ඒ සම්බන්ධ කටයුතු කිරීමට ප්‍රමාද වී ඇත.පසුව එම තනතුර පුරප්පාඩු වූ අතර ඒ සඳහා MI/MA/AD/02/07 හා 2023.07.11 දිනැති ලිපිය මඟින් සුදුසු නිත්‍ය නිලධාරියෙකු එම තනතුර සඳහා පත් කරන ලෙසත් රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත.එතෙක් උක්ත තනතුරේ රාජකාරී ආවරණය සඳහා වැඩ පිළිවෙලක් යෙදා ඇත. | නිත්‍ය තනතුරට අමතරව රාජකාරී ඉටුකිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතුයි. |
| (ii) | කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි 2:3:2 වගන්තිය අනුව ව්‍යාපෘතියක, ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර සඳහා පූර්ණකාලීන පදනම මත නිලධාරීයෙකු පත් කළ යුතු වුවද දේශගුණ විපර්යාසයන්ට අනුහුරුවීමේ ජල කළමනාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර සඳහා 2020 සැප්තැම්බර් 29 දින සිට වැඩ බැලීමේ පදනම උක්ත නිලධාරියා පත්කර තිබුණි. | අමාත්‍යාංශයේ ව්‍යාපෘති පිරිස් හා ප්‍රගති කලමණාකරන අංශය වෙතින් මේ සම්බන්ධව කරුණු විමසා ඇත. | කළමණාකරණ සේවා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කලයුතුයි. |

| | | | |
|---|---|---|---|
| (iii) | අමාත්‍යාංශය යටතේ වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු සමාගමක් ලෙස මහවැලි උපදේශන කාර්යාංශය ස්ථාපනය කර තිබුණි. රජයේ සේවයේ තනතුරක සිටියදීම එවැනි ආයතනයක තනතුරක් දැරීම සඳහා ප්‍රතිපාදන නොමැති අතර රාජ්‍ය සේවා කොමිසම් සහා කාර්ය පටිපාටි රීති ප්‍රකාරව එවැනි ආයතනයක සේවයට රජයේ නිලධාරීයෙක් තාවකාලිකව හෝ ස්ථිරව හෝ රජයේ සේවයෙන් මුදාහැරිය යුතුවේ. කෙසේ නමුත් මෙම නිලධාරීයා රජයේ සේවයේ තනතුරක සිටියදීම මහවැලි උපදේශන කාර්යාංශයේ ප්‍රධාන විධායක නිලධාරී හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ලෙස පත් කර තිබුණි. | මේ සම්බන්ධයෙන් MCB(Sec)2021 ලිපිගොනුව මඟින් කටයුතු කර ඇති බැවින් ඒ සම්බන්ධව මහවැලි උපදේශන සේවා කාර්යාංශයෙන් කරුණු විමසා ඇත. | අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිසම් සහා කාර්ය පටිපාටි රීති ප්‍රකාරව කටයුතු කලයුතුයි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 441 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 353 ක් විය. ඒ අනුව, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 16 ක, තෘතීක මට්ටමේ තනතුරු 03 ක, ද්විතීක මට්ටමේ තනතුරු 53 ක සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 16 ක් වශයෙන් පුරප්පාඩු 88 ක් විය. | 2023 අමාත්‍යාංශයේ මහවැලි අංශයේ අනුමත කාර්යය මණ්ඩලය 188 කින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 10 ක් ද ද්විතික මට්ටමේ තනතුරු 15 ක් ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 12 ක් ද පුරප්පාඩුව පවතී.බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රාථමික මට්ටමේ රියදුරු තනතුරක් සඳහා නිලධාරියෙකු තාවකාලිකව බඳවා ගෙන ඇත. | කාර්ය මණ්ඩල අවශ්‍යතාවය සමාලෝචනයට කර අනවශ්‍ය තනතුරු යටපත් කර අනුමැතිය ලබා ගත යුතුය. |